# කාර්යසාධන වාර්තාව
# செயற்திறன் அறிக்கை
# Performance Report
# 2019



අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சர் அலுவலகம்
**Prime Minister's Office**

# කාර්යසාධන වාර්තාව
# 2019

**අග්‍රාමාත්‍ය කාර්යාලය**
**58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත**
**කොළඹ 07**

**දුරකථන : 011-2575317**
**ෆැක්ස් : 011-2574143**
**විද්‍යුත් ලිපිනය :** info@pmoffice.gov.lk
**වෙබ් අඩවිය :** www.pmoffice.gov.lk

පටුන

**මාතෘකාව** **පිටු අංකය**

**1. ආයතනික පැතිකඩ** ........ **1**

1.1. හැඳින්වීම ........ 3

1.2. ආයතනික දැක්ම හා මෙහෙවර ........ 3

1.3. කාර්යභාරය ........ 4

1.4. ආයතනික සටහන ........ 5

1.5. අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ ඇති විශේෂ ඒකක ........ 6

**2. ප්‍රගතිය හා අනාගත දැක්ම** ........ **7**

2.1. ප්‍රතිපත්ති සම්පාදනය හා ආර්ථික සංවර්ධනය ........ 9

2.1.1. කායීසාධන පසු විපරම් හා සමාලෝචන රැස්වීම් ........ 9

2.1.2. මැදි ආදායම්ලාභීන් සඳහා නිවාස සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කඩිනම් වැඩසටහන ........ 9 - 10

2.1.3. ප්‍රතිපත්ති සම්පාදන කාර්යාලය ........ 11 - 13

2.1.4. සහස්‍ර අභියෝගිතා සංස්ථා ව්‍යාපෘති කාර්යාලය ........ 14

2.1.5. උතුරු පළාතේ සංවර්ධන ව්‍යාපෘති මෙහෙයවීම හා අධීක්ෂණය කිරීමේ විශේෂ ඒකකය ........ 15 - 16

2.2. ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය ........ 16

2.2.1. අග්‍රාමාත්‍යතුමා විසින් හමුවූ රාජ්‍ය තාන්ත්‍රිකයන් සහ විදේශීය ප්‍රභූවරුන් ........ 16 - 17

2.2.2. අග්‍රාමාත්‍යවරයාගේ නිල විදේශ සංචාර ........ 18

2.3. පාර්ලිමේන්තු සහ නීතිමය කටයුතු ........ 18

2.3.1. පාර්ලිමේන්තු කටයුතු ........ 18 - 22

2.3.2 නීතිමය කටයුතු ........ 22

2.4. ජාතික සංහිඳියාව සහ ආගමික කටයුතු ........ 23

2.4.1. සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය ........ 23 - 29

2.4.2. ආගමික කටයුතු ........ 29 - 31

මාතෘකාව පිටු අංකය

2.5 . මහජන පැමිණිලි/ දුක්ගැනවිලි සඳහා සහන සැලසීම 31 - 32

2.6. ආයතන කටයුතු 33

2.6.1. ඵලදායීතාව වර්ධනය කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම 33

**3. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්යසාධනය 35**

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 37

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 38 - 39

3.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය 40

**4. ආයතනයේ කාර්යසාධන දර්ශක 41**

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්මට අනුව) 43 - 48

**5. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ කාර්යසාධනය 49**

5.1. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ කාර්යසාධන දර්ශක 51 - 52

**6. මානව සම්පත් පැතිකඩ 53**

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 55

6.2. සේවක අතිරික්තය හෝ සේවක හිඟය ආයතනයේ කාර්යසාධනයට බලපාන ආකාරය 55

6.3. මානව සම්පත් සංවර්ධනය 56 - 60

**7. අනුකූලතා වාර්තාව 61**

7.1. අනුකූලතා වාර්තාව 63 - 69

**8. විගණකාධිපති නිරීක්ෂණ 71**

8.1. විගණකාධිපති නිරීක්ෂණ 73 - 76

# 1. ආයතනික පැතිකඩ

## 1.1 හැඳින්වීම

අග්‍රාමාත්‍ය කාර්යාලය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍යවරයාගේ නිල රාජකාරි කටයුතු ක්‍රියාත්මක කරන ආයතනයයි.

ඒ අනුව 2019 වසරේ ජනවාරි 01 වැනිදා සිට නොවැම්බර් 21 වනදා දක්වා අග්‍රාමාත්‍ය ධූරය දැරූ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ මගපෙන්වීම යටතේ "පංචවිධ ක්‍රියාවලිය" නම් වූ ප්‍රතිපත්ති රාමුව අනුව දේශීය ආර්ථිකය දියුණු කිරීම, දූෂණය මුලිනුපුටා දැමීම, නිදහස තහවුරු කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය හා ආයෝජන අවස්ථා ඇති කිරීම, සහ අධ්‍යාපනය ඉහළ නැංවීම යන අරමුණු මත පදනම්ව අග්‍රාමාත්‍ය කාර්යාලයේ කටයුතු ක්‍රියාත්මක විය. අනතුරුව 2019 නොවැම්බර් මස 21 වන දින ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා අග්‍රාමාත්‍ය ධූරයට පත් වීමත් සමග ජාතික ප්‍රතිපත්ති රාමුව වන "රට හදන සෞභාග්‍යයේ දැක්ම" හි අඩංගු දස වැදෑරුම් ප්‍රතිපත්තිය මත පදනම්ව,

- ඵලදායී පුරවැසියෙක්
- සතුටින් ජීවත්වන පවුලක්
- ගුණගරුක, විනය ගරුක සාධාරණ සමාජයක් සහ
- සෞභාග්‍යමත් දේශයක්

යන චතුර්විධ අරමුණු ළඟා කර ගැනීම උදෙසා අග්‍රාමාත්‍ය කාර්යාලීය කටයුතු ප්‍රතිව්‍යුහගත කර ඇත.

## 1.2 ආයතනික දැක්ම හා මෙහෙවර

### 1.2.1 දැක්ම

"ස්වාධීන, ස්වෛරී හා සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක්"


### 1.2.2 මෙහෙවර

"ශ්‍රී ලාංකීය ජනතාවගේ අපේක්ෂාවන් මල්ඵල ගැන්වීම පිණිසත්, ඔවුන්ගේ ජීවන තත්ත්වය නංවාලීම පිණිසත්, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින්, යහපාලනයෙන් යුත් විශිෂ්ට රාජ්‍ය යාන්ත්‍රණයක් උදෙසා අවැසි නායකත්වය සැපයීම"

## 1.3 ප්‍රධාන කාර්යයන්

- රජයේ ප්‍රතිපත්ති සහ තීරණ ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය මගපෙන්වීම් ලබාදීම
- අග්‍රාමාත්‍යවරයා මුලසුන හොබවන විවිධ කමිටු හා රැස්වීම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම, සම්බන්ධීකරණය හා ඒවායේ ප්‍රගතිය පසුවිපරම් කිරීම
- අග්‍රාමාත්‍යවරයාගෙන් පාර්ලිමේන්තුවේදී විමසනු ලබන ප්‍රශ්න වලට පිළිතුරු සැකසීම
- අග්‍රාමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවට යොමු කරන පනත් කෙටුම්පත් වලට අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීම
- අග්‍රාමාත්‍යවරයාට රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා පැවැත්වීමට සහ ඒවා වර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීම
- අග්‍රාමාත්‍යවරයාගේ විදේශ සංචාර සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය හා මෙහෙයවීම
- අග්‍රාමාත්‍යවරයා සහභාගීවන රාජ්‍ය හා ජාතික උත්සව සහ විශේෂ අවස්ථා සඳහා මාධ්‍ය ආවරණය සැපයීම
- ජාතික හා ආගමික උත්සව සහ සමාජ සත්කාරක සේවාවන් රාජ්‍ය අනුග්‍රහය සහිතව සංවිධානය කිරීම
- අග්‍රාමාත්‍යවරයා වෙත යොමු කරන මහජන පැමිණිලි හා දුක්ගැනවිලි, අදාල ආයතන වෙත යොමු කර සහන සැලසීමට අවශ්‍ය කටයුතු කිරීම
- අරලියගහ මන්දිරය, අග්‍රාමාත්‍ය කාර්යාලය සහ අග්‍රාමාත්‍යවරයාගේ නිල නිවාස නිසි පරිදි නඩත්තු කර පවත්වාගෙන යාම
- අග්‍රාමාත්‍ය කාර්යාලයේ දෛනික පරිපාලන හා සංවර්ධන කටයුතු ඉටුකිරීම

# 1.4 අග්‍රාමාත්‍ය කාර්යාලයේ ආයතනික සටහන




* 2019.11.21 දින දක්වා

## 1.5 අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ ඇති විශේෂ ඒකක

- ප්‍රතිපත්ති සම්පාදන කාර්යාලය - 2019.12.31 දක්වා ක්‍රියාත්මක විය.
- සහස්‍ර අභියෝගිතා සංස්ථා ව්‍යාපෘති කාර්යාලය - 2019.12.31 දක්වා ක්‍රියාත්මක විය.
- සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය - 2020.03.31 දක්වා ක්‍රියාත්මක වේ.

# 2. ප්‍රගතිය සහ අනාගත දැක්ම

## 2.1. ප්‍රතිපත්ති සම්පාදනය හා ආර්ථික සංවර්ධනය

### 2.1.1. කායිසාධන පසු විපරම් හා සමාලෝචන රැස්වීම්

කායිසාධන පසු විපරම් හා සමාලෝචන රැස්වීම් ලෙස නව මුහුණුවරකින් 2018 මැයි මස 21 දින ආරම්භ කරන ලද මෙම රැස්වීම් මගින් රටේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘතීන්වල පැන නඟින ගැටලු නිරාකරණය කිරීම හා ඒ සඳහා මඟ පෙන්වීම සිදු කරන ලදී.

**මෙම රැස්වීම් වල අරමුණු වනුයේ,**

- පසුගිය රැස්වීම් වාර වලදී සාකච්ඡා කළ කරුණු වලින් ප්‍රතිපෝෂණය ලබාගෙන වර්තමාන ප්‍රගතිය පිළිබඳව විශ්ලේෂණය කිරීම.
- දැනට හඳුනාගත් ප්‍රමාදයන් සහිත ව්‍යාපෘති අඛණ්ඩව ඉදිරියට ගෙනයාමට සහය ලබාදෙමින් අදාළ පාර්ශවයන් මුණගැස්වීම.
- පවත්නා නීතිමය රාමුවක් තුළ ආයෝජකයන්ගේ ව්‍යාපෘති කරගෙන යාමට ඇති හැකියාව පරීක්ෂා කිරීම හා මඟපෙන්වීම.
- මෙම රැස්වීම් තුළින් රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය අතර යහපත් සන්නිවේදනයක් ඇති කිරීමට වේදිකාවක් සපයා දීම.

ඒ අනුව, 2019 වසර තුළ රැස්වීම් වාර 09 ක් පවත්වා ඇති අතර, එමඟින් සාකච්ඡාවට භාජනය කර නිර්දේශ හා මඟපෙන්වීම් 10 ක් ලබාදී ඇත.

### 2.1.2. මැදි ආදායම්ලාභීන් සඳහා නිවාස සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කඩිනම් වැඩසටහන සඳහා වූ මෙහෙයුම් කමිටුව

"මාස 60 කින් අලුත් රටක් නිර්මාණය කිරීමේ පංචවිධ සැලැස්ම" ප්‍රකාරව, මැදි ආදායම්ලාභීන් සඳහා නිවාස ඉදිකිරීමේ සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කඩිනම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ උපදේශක, අග්‍රාමාත්‍ය ජ්‍යෙෂ්ඨ උපදේශක ඇතුළු නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය සහ අනෙකුත් අදාල ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත පාලන කමිටුවක් පත් කරන ලදී.

රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්වය (Public Private Partnership) යටතේ ක්‍රියාත්මක වන මෙම වැඩසටහන මඟින් ඇරඹූ නිවාස ව්‍යාපෘති 04 න් එක් ව්‍යාපෘතියක් පූර්ණ වශයෙන් ද එක් ව්‍යාපෘතියක කලාප අංක 1 ද අවසන් කර ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇත. පහත දක්වා ඇති එම

ව්‍යාපෘති වලට අමතරව, මැදි ආදායම්ලාභීන් සඳහා නිවාස ඉදිකිරීමේ සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා හඳුනාගත් ඉඩම් 2 ක ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු මේ වනවිට ආරම්භ කර ඇත.

| අනු අංකය | ව්‍යාපෘතිය | නිවාස ඒකක සංඛ්‍යාව | ව්‍යාපෘතියේ වටිනාකම (රු. මිලියන) | ප්‍රගතිය |
|---|---|---|---|---|
| 01. | ග්‍රීන්වැලි ව්‍යාපෘතිය - ජල්තර | **352** | **1892.8** | 2019.08.12 දින නිවාස ප්‍රතිලාභීන් වෙත ලබා දී ඇත. |
| 02. | මවුන්ට් ක්ලිෆර්ඩ් ව්‍යාපෘතිය - හෝමාගම | **830** | **6662.85** | කලාප අංක 01 – 2019 සැප්තැම්බර් 17 දින ප්‍රතිලාභීන් වෙත භාර දී ඇත.<br>කලාප අංක 02 වැඩ නිම වෙමින් පවතී. |
| 03. | සී බ්‍රීස් ව්‍යාපෘතිය - වාද්දුව | **196** | **1297.55** | ව්‍යාපෘති කටයුතු නැවත ආරම්භ කළ අතර වැඩ නිම වෙමින් පවතී. |
| 04. | ලවනාා හයිට්ස් ව්‍යාපෘතිය - රාගම | **124** | **750** | |

එමෙන්ම, නිවාස ඉදිකිරීම සඳහා ඉඩම් ලබාදීම, නල ජලය, විදුලිය හා මාර්ග වැනි යටිතල පහසුකම් සැපයීම සහ නිවාස ඉදිකිරීම සඳහා ප්‍රමාදයකින් තොරව අවශ්‍ය අනුමැතිය ලබා දීම සඳහා රජය කටයුතු කර තිබේ.

තවද, ප්‍රතිලාභීන් වෙත නිවාස අලෙවි කිරීමේ මිල ගණන් රජය විසින් තීරණය කරනු ලබන අතර, ප්‍රතිලාභීන් වෙත නිවාස මිලදී ගැනීම සඳහා රාජ්‍ය බැංකු මඟින් සහන පොළී අනුපාතයන් යටතේ ණය පහසුකම් ලබාදීමට ද අවශ්‍ය කටයුතු මෙහෙයුම් කමිටුව විසින් සිදු කෙරේ.

මෙම මෙහෙයුම් කමිටුව අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සම්බන්ධීකරණය කරන ලද අතර, ව්‍යාපෘතීන් නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

### 2.1.3. ප්‍රතිපත්ති සම්පාදන කාර්යාලය

2015.10.07 දිනැති කැබිනට් මණ්ඩලයේ තීරණයක් පරිදි ප්‍රතිපත්ති සම්පාදන කාර්යාලය පහත අරමුණු පෙරදැරි කොට ගනිමින් අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ ස්ථාපිත කරන ලදී.

- ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම
- ආර්ථික ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම සහ ආර්ථික සංවර්ධනය විශ්ලේෂණය සහ ඇගයීම
- දේශීය වශයෙන් ක්‍රියාත්මක ප්‍රතිපත්තීන්හි ඵලදායීතාවය සමාලෝචනය කිරීම; සහ
- ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා බලපාන බාහිර සාධක සහ ශ්‍රී ලංකාවට එමඟින් ඇතිවන බලපෑම පිළිබඳ විමසා බැලීම

මෙමගින් ප්‍රතිපත්ති සම්පාදනය කිරීම විෂයෙහි අදාල වාර්තා ඉදිරිපත් කරමින් රාජ්‍ය ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අග්‍රාමාත්‍ය කාර්යාලයට වාර්තා ඉදිරිපත් කරමින් කැබිනට් අමාත්‍යවරුන්ට සහාය දැක්වීමද සිදු කරනු ලැබේ. එමෙන්ම, ප්‍රතිපත්ති සම්පාදන කාර්යාලය මඟින් පහත සඳහන් කාර්යයන් ද සිදු කරනු ලබයි.

1. ජාතික ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ සම්පාදනය කිරීම
2. ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම
3. රාජ්‍ය අංශය සහ රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් ඉලක්කයන් සහ අභිමතාර්ථයන් සකස් කිරීම
4. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය

**ප්‍රගතිය;**

- වැඩිහිටි සත්කාර සම්බන්ධයෙන් වන වෙබ් අඩවිය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය නිර්මාණය කරන ලදී.
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සම්බන්ධයෙන් වන ජාතික ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2019 ජනවාරි මාසයේ දී ලබා දෙන ලදී.
- පුද්ගලික සෞඛ්‍ය අංක (PHN) ලබා දීමේ වැඩසටහනේ නියමු ව්‍යාපෘතිය කරාපිටිය හා ඇල්පිටිය මූලික රෝහල්වලදී අවසන් කරන ලදී
- දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහනේ නියමු ව්‍යාපෘතිය පාසල් 195 ක ක්‍රියාත්මක කරන ලදී.

- තෘතියික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව අරමුණු කරගත් ළමා ආරක්ෂණ උප කමිටුව මඟින් හඳුන්වා දෙන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) හි 04 වන මට්ටමේ ළමා සුරැකුම් පාඨමාලාව ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) හා වෘත්තීය පුහුණු අධිකාරිය (VTA) යන ආයතන මඟින් පවත්වනු ලැබේ.
- ලංකා බැංකුව හා සම්බන්ධ වී ක්‍රියාත්මක කරන ලද "තුරුණු දිරිය" ණය යෝජනා ක්‍රමයේ අපේක්ෂිත ඉලක්කය වූ තරුණ ව්‍යවසායකයින් 1000 දෙනෙකුට මූල්‍යාධාර සැපයීම සම්පූර්ණ කර ඇත.

මීට අමතරව, ප්‍රතිපත්ති සම්පාදන කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ලදී.

| අංක | අංශය | ව්‍යාපෘති |
|---|---|---|
| 1 | ජාතික ප්‍රතිපත්ති සැලසුම් කිරීම, සකස් කිරීම සහ සංවර්ධනය කිරීම | ප්‍රාථමික/ළදරු ආරක්ෂණය පිළිබඳ ප්‍රතිසංස්කරණ, වැඩිහිටි සත්කාර සහකාර පුහුණු වැඩසටහන, ක්‍රියාදාම සංචාරක වැඩසටහන ප්‍රවර්ධනය කිරීම, වෘත්තීය පුහුණු ආයතන සඳහා ප්‍රධාන කාර්ය සාධන දර්ශකය හඳුන්වා දීම, ව්‍යාපාර සඳහා සුවිශේෂී හැඳුනුම් අංකයක් හඳුන්වා දීම,ව්‍යාපාර ගැලපීම්, ක්ෂුද්‍ර මූල්‍ය පිළිබඳ පනත, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව සම්බන්ධයෙන් ප්‍රවර්ධන වැඩසටහන, ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වෘත්තීය මාර්ගෝපදේශනය, "ස්ප්‍රින්ට්"- වෘත්තීය මාර්ගෝපදේශනය, ළමා ආරක්ෂණය හා යුක්තිය සම්බන්ධයෙන් වන පනත් කෙටුම්පත, කාන්තාවන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය, සූර්ය බලශක්ති සංග්‍රාමය, දැව ශාක වාණිජ වගාව සම්බන්ධ ජාතික ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව සඳහා වන කාන්තා උප කමිටුව හා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව අරමුණු කරගත් විශේෂ පුද්ගලයින් සඳහා වන උප කමිටුව, තරුණ ව්‍යවසායකත්ව වැඩසටහන, ත්‍රීරෝද රථ නියාමනය. |

| | | |
|---|---|---|
| 2 | රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය | අභ්‍යන්තර ගුවන්සේවා සම්බන්ධ ගැටළු, රාජ්‍ය ඉඩම් තොරතුරු සහ කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම, සේවය හැරයාම පිළිබඳ සමීක්ෂණය, පරිගණක පදනම් කරගත් දුම්රිය ජාල කළමනාකරණ පද්ධතිය, රථවාහන ස්ථානීය දඩ මුදල් එකතු කිරීමේ පද්ධතිය, මාතර මහාධිකරණයේ දත්ත වාර්තා ඉලෙක්ට්‍රොනික ගොනු ගත කිරීම, කාන්තා යහපැවැත්ම සම්බන්ධ සමීක්ෂණ, ග්‍රාමීය සතිපොළ දියුණු කිරීමේ මූලික කටයුතු, ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූ වැඩිහිටියන් සහ තරුණයන් සමාජගත කිරීම සම්බන්ධයෙන් වන විශේෂ වැඩසටහන, උතුරු සංවර්ධන සම්බන්ධීකරණ කමිටුව, වාණිජමය වශයෙන් උණ ශාක රෝපණය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් වන ව්‍යාපෘතිය, ශ්‍රම ඉල්ලුම් සමීක්ෂණය, විදුලි කාර්මික ශිල්පි බලපත්‍ර රාමුව ස්ථාපිත කිරීම,තොරතුරු තාක්ෂණය පදනම් කරගත් ඉඩම් තක්සේරුකරණ පද්ධතිය, “වායු ගෝලීය කාබන් අවශෝෂණය සඳහා ගෝලීය ශාක වියනක්” ව්‍යාපෘතිය. |
| 3 | ජාතික ප්‍රතිපත්ති සැලසුම් කිරීම සහ සම්පාදනය කිරීම | යාල වනෝද්‍යානයේ සංචාරක අත්දැකීම් ඉහළ නැංවීම සඳහා වන ක්‍රියාකාරී සැලැස්ම, ජීවන වියදම් අඩු කිරීම (සහල්) සඳහා ව්‍යාපෘතිය, සුරක්ෂිතතා ජාල සමාලෝචනය. |
| 4 | ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා බලපාන බාහිර සාධක සහ ශ්‍රී ලංකාවට එමඟින් ඇතිවන බලපෑම පිළිබඳ විමසා බැලීම | තොරතුරු තාක්ෂණ උපාධි (මාර්ගගත) ශිෂ්‍යත්ව වැඩසටහන. |

### 2.1.4. සහස්‍ර අභියෝගිතා සංස්ථා ව්‍යාපෘති කාර්යාලය

ඇමෙරිකා එක්සත් ජනපදයේ, සහස්‍ර අභියෝග සංස්ථාවේ මූල්‍ය සහාය ඇතිව පස් අවුරුදු කාල රාමුවක් සහිතව අදාල ආයතන හා බලධාරීන්ගේ සහභාගිත්වයෙන් පහත දැක්වෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇත.

**1. ඉඩම් පරිපාලන ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය ප්‍රධාන වශයෙන් ඉඩම් කට්ටි ගැලපුම් සිතියම් හා රාජ්‍ය ඉඩම් ලේඛන සකස් කිරීම, ඉඩම් ප්‍රතිපත්ති සම්පාදනයේ සහ සම්බන්ධීකරණයෙහි ලා රජයේ හැකියාව වැඩිදියුණු කිරීම, ඉඩම් තොරතුරු පද්ධති සහ ඉඩම් පිළිබඳ දත්ත වැඩිදියුණු කිරීම මෙන්ම ඔප්පු ලියාපදිංචි කිරීමේ ක්‍රියා පටිපාටිය සහ ඉඩම් තක්සේරු කිරීමේ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම සඳහා, ගම්පහ, කෑගල්ල, මහනුවර, මාතලේ, කුරුණෑගල, අනුරාධපුරය, පොළොන්නරුව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කෙරේ.

**2. ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ, කොළඹ මහා නගර ප්‍රදේශය ආවරණය වන පරිදි උසස් තත්ත්වයේ රථවාහන කළමනාකරණ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම, බස්රථ ප්‍රවාහන අංශ නවීකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සහ සබරගමුව, ඌව, උතුරු මැද සහ මධ්‍යම පළාත් ආවරණය කරමින් සම්බන්ධ කෙරෙන මධ්‍යම වටරවුම් මාර්ග පද්ධතියේ කි.මී.137 ක මාර්ග කොටස්වල සංවර්ධනය හා වැඩිදියුණු කිරීම අරමුණුගතවය. තවද, කෘෂි ඵලදාවන්හි පසු අස්වනු කළමනාකරණය වැඩිදියුණු කිරීම පිණිස, පෞද්ගලික ආයෝජකයින්ගේ සහභාගිත්වය ඇතිව, මධ්‍යම වටරවුම් මාර්ග පද්ධතියේ ඒ ඒ ස්ථානවල කෘෂි නිෂ්පාදන තොග ගබඩා ස්ථාපිත කිරීම සඳහා යෝග්‍ය ස්ථාන සහ මුදල් යෙදවීම අධ්‍යයනය කිරීම ද මෙම මාර්ග සංවර්ධන වැඩසටහනට අයත් වේ.

**ව්‍යාපෘතිවල වර්තමාන ප්‍රගතිය**

අවසාන ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කර තිබේ. ආයෝජන සටහන සහස්‍ර අභියෝග ආයෝජන කළමනාකරණ කමිටුව වෙත ඉදිරිපත් කර, 2018 සැප්තැම්බර් මාසයේදී අනුමැතිය ලබා ගන්නා ලදී. ව්‍යාපෘති ගිවිසුම පිලිබඳව සාකච්ඡා කරන ලද අතර 2019 ඔක්තෝබර් මාසයේදී ව්‍යාපෘතිය සහ ගිවිසුම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය.

## 2.1.5. උතුරු පළාතේ සංවර්ධන ව්‍යාපෘති මෙහෙයවීම හා අධීක්ෂණය කිරීමේ විශේෂ ඒකකය

උතුරු සහ නැගෙනහිර පළාත්වල සංවර්ධන කටයුතු කඩිනමින් සිදු කළ යුතු බව අවධාරණය කළ ගරු අග්‍රාමාත්‍ය සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන සහ තරුණ කටයුතු පිලිබඳ අමාත්‍යවරයා, 2019 ජනවාරි 08 වන දින අදාළ පළාත් දෙකේ සිදුකළ යුතුවන සංවර්ධන කාර්යයන් සැලසුම් කිරීම සඳහා කමිටු දෙකක් පත්කළ යුතු බවට යෝජනා කළේය.

උතුරු හා නැගෙනහිර පළාත්වල සංවර්ධන වැඩපිළිවෙලට ප්‍රමුඛතාව ලබාදෙමින් අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කටයුතු සිදුකිරීමට අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් යුතුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 08 දෙනෙකුගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් පත් කෙරිණි. අදාළ කමිටුවේ පළමු රැස්වීම 2019 ජනවාරි 21 දින අරලියගහ මන්දිරයේදී පැවැත්විණි. එහිදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් උතුරු හා නැගෙනහිර පළාත් සම්බන්ධයෙන් හඳුනාගත් ගැටළු, සටහන් මගින් මෙහෙයුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට යෝජනා කෙරිණි.

නිවාස ඉදිකිරීම හා නැවත පදිංචි කිරීම, සෞඛ්‍යය, අධ්‍යාපනය, සංචාරක, ධීවර හා මාර්ග සංවර්ධන යන ක්ෂේත්‍ර රාශියක් ආවරණය කෙරෙන පරිදි උතුරු හා නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධන ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් 2019 වසරේදී සැලසුම් කෙරිණි. එක් එක් පළාතේ ක්‍රියාත්මක කෙරෙන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය සාකච්ඡාකොට සමාලෝචනය කිරීම සඳහා රේඛීය අමාත්‍යංශ හා අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ රැස්වීම් වාර කිහිපයක් ද සංවිධානය කෙරිණි.

නිවාස 10,000 ක් ඉදිකිරීම, කලාපීය වාණිජ ගුවන් යානා මෙහෙයුම් ආරම්භ කිරීමට සුදුසු පරිදි යාපනය ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීම, මඩකලපුව ගුවන්තොටුපොළ සංවර්ධනය කිරීම, ගුරුනගර්, මයිලිඩ්ඩි , කරෙයිනගර් හා පේදුරුතුඩුව යන ධීවර වරායන් පුනරුත්ථාපනය කිරීම, තල් සංවර්ධන අරමුදල, ඒකාබද්ධ මාර්ග සංවර්ධනය සහ ඩෙල්ෆ්ට් දූපත්හි මාර්ග සංවර්ධන කටයුතු, කන්කසන්තුරේ සිමෙන්ති කර්මාන්ත ශාලාව සංවර්ධනය, ඉඩම් ආපසු හිමිකරුවන් වෙත ලබාදීම, යාපනය නගරයේ මළාපවාහන ව්‍යාපෘතිය ආදී ව්‍යාපෘති මෙම රැස්වීම් අතරවාරයේදී ක්‍රියාත්මක කෙරුණු හා සාකච්ඡාවට බඳුන් වුණු ව්‍යාපෘති අතර වේ. හිටපු අග්‍රාමාත්‍යවරයා එම පළාත්වල ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට සහ ඇතැම් ව්‍යාපෘතිවල සමාරම්භක උත්සව සඳහා සහභාගීවීම වෙනුවෙන් 2019 වසර තුළ පස් වතාවක් උතුරු හා නැගෙනහිර පළාත්වල සංචාරය කළේය.

ඉහත ප්‍රයත්නයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන්, නිවාස 10,000 ක් ඉදිකිරීමේ වැඩසටහන යටතේ නිවාස 4,999 ක් සාදා නිම කිරීමට හැකියාව ලැබිණි. යාපනය ගුවන් තොටුපොළ පළමු අදියර ඉදිකිරීම් සම්පූර්ණ කිරීම, පවුල් 34,000 ක් යළි පදිංචි කිරීම, ගුරුනගර් , මයිලිඩ්ඩි යන ධීවර වරායන් අංගසම්පූර්ණ ධීවර වරායන් බවට පත්කිරීම, තල් සංවර්ධන අරමුදල ආරම්භ කිරීම, පන්දාතිප්පු පොල්තෙල්, පිරිසිදු පොල්තෙල් සහ තල නිපදවීමේ කුඩා පරිමාණ කර්මාන්ත ආරම්භ කිරීම, සහ දිස්ත්‍රික් මහ රෝහලේ හදවත් රෝග හා වෘක්කවේද ඒකකයක් ආරම්භ කිරීමට පියවර ගැනීම ආදිය 2019 වසරේ උතුරු සංවර්ධන වැඩසටහන තුළින් ලබාගත් කැපී පෙනෙන ජයග්‍රහණ වේ.

## 2.2. ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය

### 2.2.1. අග්‍රාමාත්‍යතුමා විසින් හමුවූ රාජ්‍ය තාන්ත්‍රිකයින් සහ විදේශ ප්‍රභූවරුන්

| අංකය | දිනය | මුණ ගැසුණු රාජ්‍ය තාන්ත්‍රිකයින් |
|---|---|---|
| 01 | 03.01.2019 | ගරු ජෙෆ්රි වැන් ඕඩන් මහතා, යුරෝපානු සංගම් පාර්ලිමේන්තුවේ ශ්‍රී ලාංකිකයින්ගේ මිත්‍ර සන්සදය |
| 02 | 01.02.2019 | සීෂෙල්ස් හි උප ජනාධිපති අති ගරු වින්සන්ට් මෙරිටන් මහතා |
| 03 | 04.02.2019 | මාලදිවයින් ජනාධිපති |
| 04 | 21.02.2019 | නෝර්වේ හි හිටපු අග්‍රාමාත්‍ය ජෙල් මග්න මහතා |
| 05 | 22.02.2019 | ආසියානු දේශපාන පක්ෂවල ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ මහලේකම් (ICAPP) |
| 06 | 05.03.2019 | නෝර්වේ විදේශ කටයුතු අමාත්‍යාංශයේ රාජ්‍ය ලේකම් මැරියන් හාගන් මහත්මිය |
| 07 | 22.03.2019 | සිංගප්පූරුවේ සන්නිවේදන තොරතුරු හා වෙළඳ සබඳතා අමාත්‍ය ගරු එස්. ඊශ්වරන් මහතා |
| 08 | 23.03.2019 | ඕමානයේ ඛණිජ තෙල් හා ගෑස් පිළිබඳ අමාත්‍ය අතිගරු මෙහොමඩ් බින් හමද් අල් රම්හි මහතා |
| 09 | 25.03.2019 | ඩීකින් විශ්ව විද්‍යාල සමාජිකයින් |
| 10 | 09.04.2019 | ඉන්දියානු ආරක්ෂක ලේකම් |
| 11 | 27.04.2019 | ජපානයේ ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ගරු කෙන්ජි හරාදා මහතා |

| අංකය | දිනය | මුණ ගැසුණු රාජ්‍ය තාන්ත්‍රිකයින් |
|---|---|---|
| 12 | 30.04.2019 | එක්සත් ජාතීන්ගේ ශිෂ්ඨාචාරීකරණ පිළිබඳ සන්ධානයේ ඉහළ නියෝජිත මිගුවෙල් ඒන්ජල් මොරටිනෝස් මහතා |
| 13 | 02.05.2019 | එක්සත් රාජධානියේ රාජ්‍ය ආරක්ෂාව හා ආර්ථික අපරාධ පිළිබඳ අමාත්‍ය අතිගරු බෙන් වොලස් මහතා |
| 14 | 08.05.2019 | මාලදිවයින් විදේශ කටයුතු අමාත්‍ය ගරු අබ්දුල්ලා ෂාහිඩ් මහතා |
| 15 | 10.05.2019 | තුර්කියෙහි විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍ය ගරු සෙදත් ඕනාල් මහතා |
| 16 | 04.06.2019 | ඕස්ට්‍රේලියානු ස්වදේශ කටයුතු අමාත්‍ය ගරු පීටර් ඩටන් මහතා |
| 17 | 07.06.2019 | එක්සත් ජාතීන්ගේ ත්‍රස්ථවාදය පිටුදැකීමේ විධායක අධ්‍යක්ෂ මණ්ඩලීය විධායක අධ්‍යක්ෂ මිෂේල් කොනින්ස් මහත්මිය |
| 18 | 18.06.2019 | අන්සීස් ටෙක්නොලොජීස් / මෘදුකාංග හා සේවා සපයන සමාගම්වල ශ්‍රී ලංකා සංගමයේ ප්‍රධාන විධායක නිලධාරි ස්වේන් ඔලාෆ් ඔල්සන් මහතා (SLASSCOM) |
| 19 | 31.07.2019 | ලෝක මුස්ලිම් කොංග්‍රස නියෝජිත පිරිස |
| 20 | 29.08.2019 | කැන්ටබර් හි ආදිපාද අති උතුම් ජස්ටින් වෙල්බී හිමිපාරදුන් වහන්සේ |
| 21 | 10.09.2019 | සෞදි අරාබියානු පාර්ලිමේන්තුවේ කථානායක ගරු ආචාර්ය අබ්දුල්ලා අල් ෂෙයික් මහතා |
| 22 | 18.09.2019 | චීන කොමියුනිස්ට් පක්ෂයේ මධ්‍යම කමිටුවේ දේශපාලන කාර්යාංශ සමාජික හා චොංකිං නගරසභා කමිටු ලේකම් ගරු චෙන් මයිනර් මහතා |
| 23 | 19.10.2019 | නෙදර්ලන්ත විදේශ කටයුතු අමාත්‍ය ගරු ස්ටෙෆ් බ්ලොක් මහතා |
| 24 | 04.11.2019 | නවසීලන්තයේ අධිකරණ අමාත්‍ය ගරු ඇන්ඩෲ ලිට්ල් මහතා |
| 25 | 02.12.2019 | පාකිස්ථාන විදේශ කටයුතු අමාත්‍ය ගරු මක්ඩම් ෂා මහමුද් කුරේෂි මහතා |
| 26 | 05.12.2019 | මාලදිවයින් විදේශ කටයුතු අමාත්‍ය ගරු අබ්දුල්ලා ෂහිඩ් මහතා |
| 27 | 13.12.2019 | ජපාන විදේශ කටයුතු අමාත්‍ය ගරු මොටෙගි තොෂිමිත්සු මහතා |

### 2.2.2. අග්‍රාමාත්‍යතුමාගේ නිල විදේශ සංචාර

| අංකය | දිනය | නිල විදේශ සංචාරය |
|---|---|---|
| 01 | 2019.04.23 සිට 2019.04.25 | සිංගප්පූරුවෙහි නිල සංචාරය |
| 02 | 2019.06.12 සිට 2019.06.14 | සිංගප්පූරුවෙහි නිල සංචාරය |
| 03 | 2019.09.02 සිට 2019.09.04 | මාලදිවයින් සංචාරය - ඉන්දියානු සාගර සමුළුව සඳහා සහභාගිවීම |

## 2.3. පාර්ලිමේන්තු සහ නීතිමය කටයුතු

### 2.3.1. පාර්ලිමේන්තු කටයුතු

අමාත්‍ය මණ්ඩල කාර්යාලය හා පාර්ලිමේන්තුව සම්බන්ධීකරණය කිරීම සඳහා පහත කාර්යයන් අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සිදු කරනු ලබයි.

**1. අමාත්‍ය මණ්ඩල සංදේශ හා අමාත්‍ය මණ්ඩල සටහන් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම**

2019 වර්ෂය තුළ විවිධ විෂය කරුණු වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල සංදේශ 60 ක් හා අමාත්‍ය මණ්ඩල සටහන් 29 ක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

එම අමාත්‍ය මණ්ඩල සංදේශ හා සටහන් අධ්‍යයනයට ලක් කර අමාත්‍ය මණ්ඩලය විසින් එළඹෙන තීරණ අතරින්, අග්‍රාමාත්‍ය ලේකම් විසින් ක්‍රියා කළ යුතු තීරණ ක්‍රියාත්මක කිරීමත් එකී ක්‍රියාත්මක කිරීම් සම්බන්ධව පසු විපරම් කිරීමත් අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් ඉටු කරනු ලබයි.

**2. යෝජනා සම්මත**

ජනාධිපතිවරයා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කොට පාර්ලිමේන්තුවේ දී සම්මත කර ගත යුතු යෝජනාවන් මෙන්ම අග්‍රාමාත්‍යවරයාගේ විෂය පථය යටතට ගැනෙන කරුණු

සම්බන්ධයෙන් ද පාර්ලිමේන්තුව වෙත යෝජනා සම්මතයන් ඉදිරිපත් කර සම්මත කර ගැනීමට අදාළව සියලු කටයුතු අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සිදු කරනු ලබයි.

ඒ අනුව, 2019 ජනවාරි 01 වන දින සිට 2019 දෙසැම්බර් 31 වන දින දක්වා පහත සඳහන් යෝජනා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර සම්මත කර ගැනීමට පියවර ගෙන ඇත.

- පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ වැටුප හා දීමනා ප්‍රතිශෝධනය කිරීම
- 1998 අංක 45 දරන පෞද්ගලික ආරක්ෂක නියෝජ්‍යායතන පනත
- මහජන ආරක්ෂක ආඥා පනත
- ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ යෝජනාව
- 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනත
- විගණකාධිපති ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න මහතාගේ වැටුප නිශ්චය කිරීම

## 3. පාර්ලිමේන්තු ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම

➢ අග්‍රාමාත්‍යවරයා විසින් ජනාධිපතිවරයා හා අග්‍රාමාත්‍යවරයාගේ විෂය පථය යටතට අයත් වන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සංස්ථාවන්ට අදාළව විපක්ෂ හා ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරුන් විසින් 2019 වසර තුළ අග්‍රාමාත්‍යතුමා වෙත යොමු කරන ලද වාචික ප්‍රශ්න තිස්දෙකකට (32) පිළිතුරු කෙටුම්පත් කර ඇති අතර එම ප්‍රශ්න පහත පරිදි වේ.

- ජනාධිපතිවරයාගේ විෂය පථය යටතට අයත් වූ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය සහ ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථයන් යටතට අදාල කරුණු සම්බන්ධයෙන් අසන ලද වාචික ප්‍රශ්න විසිහතකට (27) ට පිළිතුරු කෙටුම්පත් කර ඇත.
- අග්‍රාමාත්‍ය කාර්යාලයේ විෂය පථයට අයත් වන කරුණු සම්බන්ධයෙන් අසන ලද වාචික ප්‍රශ්න හතරකට (04) ට පිළිතුරු කෙටුම්පත් කර ඇත.
- ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ වන හා අග්‍රාමාත්‍ය කාර්යාලයේ විෂය පථයන් යටතට අයත් වන කරුණු සම්බන්ධයෙන් අසන ලද වාචික ප්‍රශ්න එකකට (01) පිළිතුරු කෙටුම්පත් කර ඇත.

- ඉහත ප්‍රශ්න අතුරින් අතුරු ප්‍රශ්න 12 ක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් විමසා ඇති අතර එම ප්‍රශ්න අදාල අමාත්‍යාංශ වෙත යොමු කර පිළිතුරු කෙටුම්පත් කර පාර්ලිමේන්තුව වෙත යවා ඇත.

- පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 27/2 යටතේ අග්‍රාමාත්‍යවරයා වෙත යොමු කරනු ලබන ප්‍රශ්න දහයකට (10) පිළිතුරු කෙටුම්පත් කර ඇත.

- ජාතික වැදගත්කමකින් යුත් ප්‍රතිපත්තිමය කරුණු ඔස්සේ සෑම මසකම පාර්ලිමේන්තු රැස්වීම පැවැත්වෙන පළමු බදාදා දින අග්‍රාමාත්‍යවරයාගෙන් ප්‍රශ්න ඇසිමේ අවස්ථාව යටතේ අසනු ලබන වාචික ප්‍රශ්න 04 ක් සඳහා පිළිතුරු ලබා දීම සිදු කරනු ලබයි. ඒ අනුව, වාචික ප්‍රශ්න හතර බැගින් අවස්ථා 04 දී ප්‍රශ්න දහසයකට (16) 2019.12.31 දින වන විට පිළිතුරු කෙටුම්පත් කර ඇත.

- සභාව කල් තැබීමේ යෝජනා දහහතරක් (14) ක් ඉදිරිපත් කර ඇත.

## 4. පාර්ලිමේන්තු වාර්තා සභාගත කිරීම

ජනාධිපතිවරයාගේ හා අග්‍රාමාත්‍යවරයාගේ විෂය පථය යටතට ගැනෙන විෂය කරුණු සම්බන්ධයෙන් වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු අවස්ථාවන්හිදී, විශේෂයෙන් වාර්ෂික වාර්තා, කාර්ය සාධන වාර්තා හා ගිණුම් ප්‍රකාශ පාර්ලිමේන්තුවෙහි සභාගත කිරීමට අවශ්‍ය කටයුතු අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් සිදු කරනු ලබන අතර, මේ වන විට පහත කරුණු යටතේ වාර්තා 30 ක් පාර්ලිමේන්තුවේ සභාගත කර ඇත. එම වාර්තා පහත පරිදි වේ.

- **වාර්ෂික වාර්තා**

| | | | |
|---|---|---|---|
| i | ජාතික මුදල් කොමිෂන් සභාව | - | 2017 |
| ii | ජාතික පොලිස් කොමිෂන් සභාව | - | 2018 |
| iii | රණවිරු සේවා අධිකාරිය | - | 2015 |
| iv | විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | - | 2014 |
| v | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | - | 2017 |
| vi | අධිකරණ සේවා කොමිෂන් සභාව | - | 2017 |
| vii | ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව | - | 2017 |
| viii | පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය | - | 2017 |

ix ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව - 2014,2015,2016

x රාජ්‍ය සේවා කොමිෂන් සභාව - 2018

xi ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව - 2017,2018

- **ප්‍රගති වාර්තා**

i සීමා නිර්ණය කොමිෂන් සභාව - 2018

- **කාර්තු ප්‍රගති වාර්තා**

i රාජ්‍ය සේවා කොමිෂන් සභාව - දෙවන කාර්තු වාර්තාව (2018.04.01-2019.06.30)

ii රාජ්‍ය සේවා කොමිෂන් සභාව - තෙවන කාර්තු වාර්තාව (2019.07.01-2019.09.31)

iii රාජ්‍ය සේවා කොමිෂන් සභාව - පළමු කාර්තු වාර්තාව (2019.01.01-2019.03.31)

iv රාජ්‍ය සේවා කොමිෂන් සභාව - දෙවන කාර්තු වාර්තාව (2019.04.01-2019.06.30)

- **කාර්ය සාධන වාර්තා**

i. මැතිවරණ කොමිෂන් සභාව -2018

- **කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් වාර්තා**

i. රාජ්‍ය සේවා කොමිෂන් සභාව - 2018

- **වාර්ෂික වාර්තා හා ගිණුම් ප්‍රකාශ**

i. ජාතික මුදල් කොමිෂන් සභාව - 2018

ii. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව - 2017

iii. ශ්‍රී ලංකා පදනම් ආයතනය - 2018

iv. ශ්‍රී ලංකා පදනම් ආයතනය - 2017

v. ජාතික පොලිස් කොමිෂන් සභාව - 2017

vi. ශ්‍රී ලංකා මානවහිමිකම් කොමිෂන් සභාව - 2015

- **ස්ථාවර නියෝග 119(4) ට අනුව ස්වාධීන කොමිෂන් සභා මඟින් ගත් ක්‍රියා මාර්ග ඉදිරිපත් කිරීම යටතේ පහත කාර්යාලයන්ගේ නිරීක්ෂණ පාර්ලිමේන්තුව වෙත යොමු කර ඇත.**
    1. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
    2. ජාතික විගණන කාර්යාලය
    3. විගණන සේවා කොමිෂන් සභාව
    4. පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය

- **2019 වර්ෂය සඳහා වන නිර්දේශ**

  ජාතික මුදල් කොමිෂන් සභාව 2019

- **මාර්ගෝපදේශ ඉදිරිපත් කිරීම**

  ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව 2018

### 2.3.2. නීතිමය කටයුතු

අග්‍රාමාත්‍යවරයාගේ විෂය පථය යටතට ගැනෙන විවිධ නෛතික කාර්යයන්ට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, ශ්‍රේෂ්ඨාධිකරණයේ හා අභියාචනාධිකරණයේ මූලික අයිතිවාසිකම් හා රිට් නඩු සම්බන්ධව අග්‍රාමාත්‍යවරයා හෝ අග්‍රාමාත්‍ය ලේකම් වග උත්තරකරු කරමින් පවරා ඇති නඩු කටයුතු සම්බන්ධව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය සිදු කිරීම අග්‍රාමාත්‍ය කාර්යාලයේ නීති අංශය විසින් ඉටු කරනු ලබයි.

ඒ අනුව, 2019 ජනවාරි 01 වන දින සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුළ පහත පරිදි නඩුකර පවරා ඇත.

| | | |
|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | - | මූලික අයිතිවාසිකම් නඩුකර 43 |
| අභියාචනාධිකරණය | - | රිට් නඩුකර 07 |

## 2.4. ජාතික සංහිඳියාව සහ ආගමික කටයුතු

### 2.4.1. සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය

සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අනුව, 2015 වර්ෂයේදී අග්‍රාමාත්‍ය කාර්යාලය යටතේ ස්ථාපිත කෙරිණ. සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලයෙහි මූලික පරමාර්ථය වන්නේ ශ්‍රී ලංකාවේ සංහිඳියා ක්‍රියාවලිය ආශ්‍රිත තීරණ, වැඩසටහන් සහ ක්‍රියාදාමයන් ක්‍රියාත්මක කිරීම වේ.

**සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලයෙහි අරමුණු;**

- සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම.
- ගැටුම් නැවත ඇති නොවීම තහවුරු කරමින් සංහිඳියාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැළසීම.
- ධාරිතා සංවර්ධනය
- සන්නිවේදනය සහ සබඳතා
- එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිල (UNHRC) යෝජනා අංක 31/1 සහ 34/1 යෝජනාවන්ට අනුකූලව කටයුතු කරන බවට තහවුරු කර ගැනීම.

**සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය මඟින් පවත්වා ගෙන යනු ලබන ප්‍රධාන කාර්යයන්**

**1. සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම.**

- අතුරුදන් වූවන් සඳහා නිකුත් කරන "නොදුටු සහතික" (Certificate of Absence) පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් (COA)

  අතුරුදන් වූ පුද්ගලයින්ගේ ඥාතීන් වෙත, "නොදුටු සහතික" නිකුත් කිරීමේ අරමුණ සාක්ෂාත් වන බවට තහවුරු කර ගැනීම සඳහා, බැංකු හා රක්ෂණ ක්ෂේත්‍රයේ නීති පිළිබඳ දෙපාර්තමේන්තු ඇතුළු අනෙකුත් අදාළ රජයේ නිලධාරීන්ට "අතුරුදන්වීම පිළිබඳ නොදුටු සහතික නිකුත් කිරීම සම්බන්ධයෙන් වන සිද්ධාන්තමය හා ප්‍රායෝගික ගැටළු" යන මැයෙන් නොදුටු සහතික පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළුවක් සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය මඟින් පවත්වනු ලැබීය. මෙම වැඩමුළුව 2019 ජනවාරි 31 වැනි දින කොළඹ දී පැවැත්විණි.

- සත්‍ය හා සංහිඳියාව පිළිබඳව කොමිෂන් සභාව පිහිටුවීම සඳහා අනුග්‍රහය ලබා දීම.
  සත්‍ය හා සංහිඳියා කොමිෂන් සභාවක් ශ්‍රී ලංකාව තුළ පිහිටුවීමට අදාළ සංකල්ප පත්‍රිකාව සහ පනත් කෙටුම්පත් පිළියෙළ කිරීමෙහි ලා සම්බන්ධීකරණය සිදු කරන ලදී. මීට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය, 2019 පෙබරවාරි මාසයේදී අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරිණි.

- උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සහ උපදේශන කාර්ය සාධන බලකාය මඟින් ලබා දෙන නිර්දේශ ක්‍රියාත්මක කිරිමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම.
  උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව (LLRC) සහ උපදේශන කාර්යසාධන බලකාය (CTF) විසින් ලබා දී ඇති වාර්තාවල අන්තර්ගත නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සොයා බැලීම සඳහා සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය මඟින් අදාළ වාර්තා සම්බන්ධයෙන් අධ්‍යයනයක් සිදු කෙරේ.

**2. ගැටුම් යළි ඇති නොවන බවට තහවුරු කොට සංහිඳියාව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැළසීම.**

- ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැළැස්ම 2017 – 2021 (NHRAP)
  - ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැළැස්මෙහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එය ක්‍රියාත්මක කිරිමට අදාළ නියෝජිතායතන සමඟ එක්ව ප්‍රගතිය අධීක්ෂණය සහ පසු විපරම් කටයුතු කිරීම සංහිඳියා යාන්ත්‍රණය සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය වෙත පැවරී ඇත. ඒ අනුව අග්‍රාමාත්‍ය කාර්යාලය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළයුතු කාර්ය සාධන වාර්තා සකස් කිරීම වෙනුවෙන් ආංශික කමිටු 10 හි මාසික ප්‍රගතිය පිළිබඳ වාර්තා එක්රැස් කොට වාර්තා පිළියෙළ කිරීම සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය සිදු කරයි.

  - නියම කරන ලද කාල රමුව තුළදී ජාතික මානව හිමිකම් ක්‍රියාකාරී සැලැස්ම කෙරෙහි දැඩි අවධානය යොමු කොට, එම සැලස්ම කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අදාළ ආංශික කමිටු වෙත සහය වීම පිණිස එම ආංශික කමිටු සහ තෝරාගත් වගකිව යුතු කේන්ද්‍රස්ථාන ඉලක්ක කළ වැඩමුළුවක් සංවිධානය කිරීමට සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය කටයුතු කරන ලදී. ප්‍රමුඛ පෙළේ සම්පත්දායකයින් පිරිසකගේ සහභාගීත්වයෙන් යුතුව මෙම වැඩමුළුව 2019 මාර්තු 12 වැනි දින පැවැත්විණි.

- ණය සහන ලබාදීමේ ව්‍යාපෘතිය

  - රජය විසින් ආරම්භ කරන ලද ණය සහන ලබාදීමේ වැඩසටහනට සහාය දැක්වීමේ අරමුණෙන්, මුදල් අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද, සමුපකාර ග්‍රාමීය බැංකු පරිගණකගත කිරීමේ වැඩසටහන සඳහා සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලයීය සහාය හිමිවිය. දැනට ක්‍රියාත්මක ණය සහන ලබාදීමේ වැඩසටහන් වෙනුවෙන් ද මුදල් අමාත්‍යාංශය වෙත සහාය ලබාදීමට සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය ඉදිරිපත් විය.

  - 2019 පෙබරවාරි මාසයේදී සම්පූර්ණ කෙරුණු උතුරු පළාත් සංවර්ධන වැඩසටහනේ කාල රාමුව වැඩි දියුණු කිරීමේ කාර්යයට මුදල් අමාත්‍යාංශය වෙත සහය වීමද සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය හරහා සිදු විය.

- අදාළ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කිරීම

කාන්තාවන් විසින් මුහුණදෙන ක්ෂුද්‍ර මූල්‍ය ගණුදෙනුවලට අදාළ ගැටළු, ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ සමයේ ඇති වූ මානසික සෞඛ්‍ය පිරිහීමේ ගැටළු, ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය තුළ ශ්‍රී ලාංකේය කාන්තාවගේ භූමිකාව, සංක්‍රාන්තික යුක්තිය, ආබාධිත හා විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින් පිළිබඳව මෙන්ම සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම පිළිබඳව ද අදාළ පාර්ශවකරුවන්ගේ ද සහාය ඇතිව පර්යේෂණ සිදු කිරීම සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය මඟින් සිදුවේ.
කාන්තාවන්, සාමය සහ ආරක්ෂක වැඩපිළිවෙල පිළිබඳව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිල යෝජනා අංක 1325 සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ මහලේකම් විසින් ඉදිරිපත් කළ ප්‍රශ්නාවලියට අදාළ කටයුතු සඳහා කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුවට සහායවීම ද සිදු කරන ලදී.

## 3. ධාරිතා සංවර්ධනය

- අපරාධ යුක්තිය පසිඳලීමේ පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා නීති නිලධාරීන් හට විදේශ පුහුණුවාර සංවිධානය.

ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනයේ (JICA) සහාය ඇතිව සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය මඟින් ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනාවකට ජපාන රජයේ අනුමැතිය ලැබිණ. නීතිපති දෙපාර්තමේන්තුව,

අධිකරණය, අධිකරණ වෛද්‍ය නිලධාරී, අධිකරණ අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පොලිසිය වැනි ශ්‍රී ලංකාවේ අපරාධ යුක්තිය පසිඳලීමේ විවිධ ආයතන වලින් තෝරාගත් රජයේ නිලධාරීන් සඳහා ජපානයේ පුහුණුව ලබා දීම තුළින් අපරාධ යුක්තිය පසිඳලීමේ ප්‍රමාදයන් අඩු කිරීම මෙමගින් අපේක්ෂා කෙරේ.

- සංක්‍රාන්තිත යුක්තිය සහ සංහිඳියා යාන්ත්‍රණය (TJR) පිළිබඳව රාජ්‍ය නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කිරීම

සංක්‍රාන්තිත යුක්තිය සහ සංහිඳියා යාන්ත්‍රණය පිළිබඳව දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සහ සංහිඳියා යාන්ත්‍රණයට අදාළ තවත් අමාත්‍යාංශ දෙකක් වූ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම්, පුනරුත්ථාපන, පළාත් සංවර්ධන වෘත්තීය පුහුණු සහ නිපුණතා සංවර්ධන හා තරුණ කටයුතු අමාත්‍යාංශය සහ ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය යන අමාත්‍යාංශවල නිලධාරීන් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩමුළු මාලාවක් අනුරාධපුර, කොළඹ, ත්‍රිකුණාමලය, මාතර, කිලිනොච්චි, සහ මහනුවර යන ප්‍රදේශවල දී 2019 ජනවාරි 21 වන දින සිට මාර්තු 05 වන දින දක්වා පැවැත්විණි. රාජ්‍ය නිලධාරීන්, යුද්ධයෙන් පීඩාවට පත්වූවන් මුහුණ දෙන ගැටළු පිළිබඳව සංවේදීභාවයට පත් කිරීමත් සංක්‍රාන්තික යුක්තිය සහ සංහඳියා ක්‍රියාවලිය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමේදී ඔවුන් සතු කාර්යභාර්ය පිළිබඳව දැනුවත් කිරීමත් එහි අරමුණ විය.
මෙම වැඩමුළු සඳහා එක්සත් ජාතීන්ගේ සාමය ගොඩනැගීමේ අරමුදලෙන් ආධාර ලැබිණි.

- ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රජා පොලිස් කමිටු සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන

සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය හා ශ්‍රී ලංකා පොලිසිය, "ජාතික සමඟිය සහ සංහිඳියා සංවාදය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රජා පොලිස් කමිටු පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම" සම්බන්ධයෙන් වන අවබෝධතා ගිවිසුමකට 2018 අගෝස්තු 7 වැනි දින අත්සන් තැබීය.

ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කරන්නට යෙදුණු ජාතික සමගිය, සංහිඳියාව සහ සහජීවන සංවාදය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් සාමය ගොඩනැගීම සඳහා ක්‍රියාකරන්නන් කණ්ඩායමක් බිහිකිරීම මෙම ඒකාබද්ධ ක්‍රියාමාර්ගයේ අරමුණ විය.

2019 මාර්තු 6 සිට 31 දක්වා කොළඹදී පැවැති වැඩසටහන සමඟ දිවයින පුරා නිලධාරීන් 569 ක් සඳහා පුහුණුව ලබාදෙමින් මෙම වැඩසටහන් 2019 වසර පුරා ක්‍රියාත්මක විය.

## 4. සන්නිවේදනය සහ සබඳතා

- සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය සහ ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහයෝගය ඇතිව 2019 මාර්තු 12 වැනි දින භාෂා විගණනය කිරීමේ පළමු අදියර පවත්වන්නට යෙදුණි. මෙම ක්‍රියාමාර්ගයේ අරමුණ වන්නේ රටේ පොදු ජනතාවට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම රාජ්‍ය සේවය ලබා ගැනීමට ඇති හැකියාව තහවුරු කිරීමයි.

- ගම්පහ දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල්වල ක්‍රියාත්මක කෙරුණු “අහන්න” වැඩසටහනේ III අදියර 2019 සැප්තැම්බර් මස පැවැත්විණි.

- පුහුණුකරුවන් සඳහා හමුදා පුහුණුව (TOT) වැඩසටහන සහ හමුදා සංවාදය 2019
  - විදේශ කටයුතු පිළිබඳ ස්විට්සර්ලන්ත ෆෙඩරල් දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව ශ්‍රී ලංකා යුධ හමුදා, නාවික හමුදා, ගුවන් හමුදා, ශ්‍රී ලංකා පොලිසිය සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තු නිලධාරීන් 30 දෙනෙකු වෙනුවෙන් මැලේසියාවේදී පවත්වන ලද දින අටක නේවාසික වැඩමුළුව.
  - සංක්‍රාන්තික යුක්තිය සහ සංහිඳියාව පිළිබඳව පුහුණුකරුවන් පුහුණු කරවීමේ වැඩසටහන - ත්‍රිවිධ හමුදා, ශ්‍රී ලංකා පොලීසිය සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 30 දෙනෙකු සඳහා වූ දින 05 ක නේවාසික වැඩසටහන කුකුලේගඟ දී පැවැත්විණි.
  - සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය, ආරක්ෂක අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවිධානය එක්ව සංවිධානය කරන ලද හමුදා සංවාද වැඩසටහනෙහි සමුළු වාර 10 ක් 2019 ජුලි 08 වන දින සිට සැප්තැම්බර් 19 වන දින දක්වා ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමෙන්තුවේ කණිෂ්ඨ නිලධාරීන්, මධ්‍යම ශ්‍රේණිවල නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ අධිකාරි - නොලත් නිලධාරීන් 800 දෙනෙකු වෙනුවෙන් පවත්වා අවසන් කරන ලදී.

- මාධ්‍ය වැඩමුළු

  - සංහිඳියාව පිළිබඳව ජනමාධ්‍ය සමඟ සංවාදයක් ගොඩනැගීමේ අරමුණෙන් ප්‍රාදේශීය මාධ්‍ය වාර්තාකරුවන් වෙනුවෙන් වැඩමුළු 08 ක් කොළඹ, කළුතර, යාපනය, මහනුවර, ගාල්ල, අනුරාධපුර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය යන ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් පවත්වන්නට යෙදුණි.

  - සමාජ මධ්‍ය ජාල වාර්තාකරුවන් අතර සංහිඳියා යාන්ත්‍රණය පිළිබඳව අවබෝධය පුළුල් කිරීමත් මෙම ක්‍රියාවලියේදී ඔවුන් සතු කාර්ය භාර්ය පිළිබඳව කතිකාවක් ගොඩනැගීමත් අරමුණු කරගනිමින් රත්නපුර, කොළඹ, කළුතර, ගම්පහ සහ කුරුණෑගල ප්‍රදේශවලදී වැඩමුළු සංවිධානය කෙරිණි.

මෙම වැඩමුළු සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමය ගොඩනැගීමේ අරමුදලෙන් ආධාර හිමිවිය.

## 5. වෙනත් ක්‍රියාකාරකම්

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිල යෝජනා අංක 30/1 සහ 34/1 සඳහා අනුකූලව ක්‍රියාකිරීම තහවුරු කිරීම වෙනුවෙන්, PEO Tv රූපවාහිනී ජාලයේ භාෂා අධ්‍යාපනය ලබා දෙන චැනලයක් ආරම්භ කිරීම, අතුරුදන් වූවන්ගේ පවුල්වල සාමාජිකයින්ට මුහුණදීමට සිදුවන මානසික මැදිහත්කරණයන් පිළිබඳව ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ ජාත්‍යන්තර කමිටුව විසින් පවත්වන ලද සාකච්ඡා මණ්ඩලවලට සහභාගී වීම, ත්‍රස්තවාදය පිටු දැකීමේ පනතට අදාල පාර්ලිමේන්තු ආංශික නිරීක්ෂණ කමිටුවට සහභාගීවීම, ශ්‍රී ලංකාවේ සංහිඳියා යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් GIZ විසින් පවත්වන ලද වට මේස සාකච්ඡාවලට සහභාගී වීම, සමානාත්මතාව සහ යුක්තිය සඳහා වන මධ්‍යස්ථානය මඟින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකාවේ සිදුවන ළමා විවාහ පිළිබඳ මූලික අධ්‍යයනය සඳහා දායකත්වය ලබාදීම, රුවන්ඩාහි පශ්චාත් අරගල සමයේ මානසික සහනය උදාකරලීම සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ සම්මන්ත්‍රණයක් පැවැත්වීම, GIZ මඟින් පවත්වන ලද සංහිඳියා වැඩසටහන ශක්තිමත් කිරීමට පියවර ගැනීම වැනි ක්‍රියාකාරකම්වලට සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය, සිය දායකත්වය සහ සහභාගීත්වය ලබා දුන්නේය.

මීට අමතරව, සංක්‍රාන්තික යුක්තිය සහ සංහිඳියාව පිළිබඳව සමාජ මාධ්‍ය 20 ක් සඳහා කෙටි වීඩියෝ පට නිර්මාණය කොට ප්‍රචාරණය කිරීම, යුක්තිය සහ සාධාරණය ඇති කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව බොස්නියානු හා හර්සගෝවීනා අත්දැකීම් අනෙකුත් පාර්ශවකරුවන් හා හුවමාරු කරගැනීම මෙන්ම ප්‍රජාවන් අතර හිංසනය පැතිරයාම වැළැක්වීමට අවශ්‍ය පියවර ගැනීම පිළිබඳව සිවිල් සමාජය වෙනුවෙන් වැඩමුළු සංවිධානය කිරීම වැනි ක්‍රියාමාර්ග රාශියකදී සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය දායකත්වය ලබා දී ඇත.

## 2.4.2. ආගමික කටයුතු

බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා ක්‍රිස්තියානි ආගම් අතර, ආගමික සංහිඳියාව ඇතිකරලීමේ අරමුණින්, සෑම ආගමක්ම නියෝජනය වන පරිදි එක් ප්‍රධාන ආගමික වැඩසටහනක් අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් ජාතික මට්ටමින් සැමරීමට කටයුතු කර ඇත. ඒ අනුව, 2019 වසර තුළ පහත ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

- **තෛපොංගල් උත්සවය**

තෛපොංගල් උත්සවය, 2019 ජනවාරි 13 දින, අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය හා එක්ව අරලියගහ මන්දිරයේදී පවත්වන ලදී. මෙම උත්සවය සඳහා, විපක්ෂ නායකතුමා ඇතුළු මැති ඇමතිවරුන් රැසක් සහභාගී වූහ.

- **අරලියගහ මන්දිර පරිශ්‍රයේ රෝපිත ජය ශ්‍රී මහා බෝධි ශාඛාවහන්සේ අභියස පවත්වන ලද ආශිර්වාද බෝධි පූජා මහා පිංකම**

උතුරු නැගෙනහිර ගැටුම් නිමකර දස වසරක් සපිරීම නිමිත්තෙන් මියගිය රණවිරුවන්ට පිං පැමිණවීම මෙන් ම, 2019.04.21 දින සිදු වූ බෝම්බ ප්‍රහාරයෙන් මියගිය පිරිසට පිං පැමිණවීම හා එහිදී තුවාල ලැබූ අයට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීමේ අරමුණු පෙරදැරිව අග්‍රාමාත්‍ය, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2019 මැයි මස 19 වන දින ප.ව. 05.00 ට අරලියගහ මන්දිර පරිශ්‍රයේ රෝපිත ජය ශ්‍රී මහා බෝධි ශාඛාවහන්සේ අභියස ආශිර්වාද බෝධි පූජා මහා පිංකමක් පවත්වන ලදී.

අමාත්‍යවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිරිසක් ද මෙම ආශිර්වාද බෝධි පූජා මහා පිංකම සඳහා සහභාගී වූ අතර මෙම අවස්ථාව රූපවාහිනී නාලිකා ඔස්සේ සජීවීව ද විකාශනය කරන ලදී.

- **"සිසු දම් සරණි" පාසල් සිසුන් 2500 ක් සිල් සමාදන් කරවීමේ වැඩසටහන**

පාසැල් සිසුන්ගේ ගුණධර්ම වර්ධනය කිරීමේ අරමුණ පෙරදැරිව, පොසොන් පොහොය නිමිතිකරගෙන, සිසුන් සිල් සමාදන් කරවීමේ වැඩසටහනක් 2019 ජූනි මස 14 වන දින අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී.
කොළඹ අවට පාසල් 23 ක් නියෝජනය කරමින් පාසල් සිසුන් 2500 ක් ඇතුලුව අදාල විදුහල්වල විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරින්ද මෙම වැඩසටහන සඳහා සහභාගි විය. භාවනා කිරීමේ ප්‍රායෝගික අභ්‍යාස, මෙන්ම සිසු ගුණදම් වර්ධනය කිරීමේ ධර්ම දේශනා සහ හරවත් දේශන ද ඇතුළත්ව පවත්වන ලද මෙම වැඩසටහන සඳහා සහභාගී වූ පිරිස සඳහා මහජන බැංකුව විසින් තිළිණයක් ද ප්‍රදානය කරන ලදී. මෙම වැඩසටහන රූපවාහිනී නාලිකා ඔස්සේද විකාශනය කරන ලදී.

- **කොල්ලුපිටිය, වාළුකාරාම විහාරස්ථානයේ වාර්ෂික ඇසළ මහා පෙරහැර**

අන්තර් - ආගමික සහජීවනය තුලින් ජාතික සංහිඳියාව ගොඩ නැගීමේ අරමුණින්, අග්‍රාමාත්‍ය කාර්යාලයේ ද සංවිධාන දායකත්වයෙන් කොල්ලුපිටිය, වාළුකාරාම විහාරස්ථානයේ, වාර්ෂික ඇසළ මහා පෙරහැර 56 වන වරටත්, 2019 සැප්තැම්බර් මස 27 වන දින ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

අති උත්කර්ෂවත් ලෙස පවත්වන ලද මෙම පෙරහැර, අලි ඇතුන් විශාල සංඛ්‍යාවක්, දේශීය හෙළ උරුමය විදහා දක්වන උඩරට, පහතරට හා සබරගමුව කලා සම්ප්‍රදායයන්ට අයත් වර්ණවත් නැටුම් සංදර්ශන සහ විවිධ අංග රාශියකින් සමන්විත විය.

අමාත්‍යවරුන්, විශේෂ ආරාධිත අමුත්තන්, දෙස් විදෙස් තානාපතිවරුන් හා විදේශීය සංචාරකයින් රාශියක් මෙම පෙරහැර නැරඹීම සඳහා සහභාගී වූ අතර මෙම පෙරහැර මංගල්‍ය රූපවාහිනී නාලිකා ඔස්සේද සජීවීව විකාශනය කරන ලදී.

- **ධර්ම දේශනා වැඩසටහන**

අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයකට අනුව, ප්‍රඥාසම්පන්න දැහැමි ජන සමාජයක් උදෙසා බුදු දහමේ සිසිලස බෙදාදීමේ අරමුණ පෙරදැරිව, සෑම පුරපසළොස්වක් පොහෝ දිනකම ධර්ම දේශනාවක් පැවැත්වීමේ වැඩසටහන 2019 වර්ෂයේ උඳුවප් පුර පසළොස්වක පොහෝ දින සිට නැවතත් ආරම්භ කරන ලදී.
ඒ අනුව, මෙම ධර්ම දේශනා මාලාවේ 192 වැනි දහම් දෙසුම 2019 දෙසැම්බර් මස 10 වන දින අග්‍රාමාත්‍ය ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සහභාගිත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදී.

කිරුළපන ඇලන් මැතිනියාරාමාධිවාසී, විචිත්‍ර ධර්ම කථික, ගෞරවාර්හ පූජ්‍ය උඩුවේ ධම්මාලෝක ස්වාමින් වහන්සේ විසින් ධර්ම දේශනාව පවත්වන ලද අතර, අග්‍රාමාත්‍ය කාර්යාලයේ කාර්ය මණ්ඩලය මෙන්ම දිවයිනේ නන්දෙසින් පැමිණි සදැහැවතුන් විශාල පිරිසක් ධර්ම දේශනාව ශ්‍රවණය කිරීම සඳහා සහභාගි විය. මෙම වැඩසටහන රූපවාහිනී නාලිකා ඔස්සේද සජීවීව විකාශනය කරන ලදී.

## 2.5. මහජන පැමිණිලි/දුක්ගැනවිලි සඳහා සහන සැලසීම

- **අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලැබෙන මහජන පැමිණිලි / දුක්ගැනවිලි අදාල රාජ්‍ය ආයතන වෙත යොමු කිරීම හා ප්‍රගතිය පසුවිපරම් කිරීම**

අග්‍රාමාත්‍යතුමා වෙත යොමු කරනු ලබන මහජන ගැටලු/ දුක්ගැනවිලි ඉතා කාර්යක්ෂමව හා ඵලදායීව කළමනාකරණය කිරීමේ මූලික අරමුණ පෙරදැරිව, අග්‍රාමාත්‍ය කාර්යාලයේ මහජන පැමිණිලි අංශය ස්ථාපිත කොට ඇත.

දිවයිනේ සියලු රාජ්‍ය ආයතන වලට අදාලව ඉදිරිපත් කරනු ලබන මහජන පැමිණිලි හා සේවා ඉල්ලීම් කඩිනමින් ඉටුකර දීම සඳහා, අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම ද මෙම අංශය මඟින් සිදු කෙරේ. එමෙන්ම අදාල මහජන ඉල්ලීම්, අවශ්‍යතාවයන් ඒ ඒ ආයතනවලින් ඉටු කිරීම පිළිබඳ ප්‍රගතිය නිරන්තරයෙන්ම විමසමින්, අදාල මහජන අවශ්‍යතාවයන් ඉටු කිරීම පිළිබඳ පසුවිපරම් කිරීම ද සිදු කරනු ලබයි.

**ඉදිරිපත් වූ මහජන අවශ්‍යතා / පැමිණිලි හා ඒවා පිළිබඳව ගත් ක්‍රියාමාර්ග සහ ප්‍රගතිය**

| **මාසය** | **ලැබුණු මුළු ලිපි ප්‍රමාණය** | **පිළිතුරු යවන ලද මුළු ලිපි ප්‍රමාණය** |
|---|---|---|
| ජනවාරි | 2,374 | 2,182 |
| පෙබරවාරි | 1,799 | 1,471 |
| මාර්තු | 2,660 | 1,123 |
| අප්‍රේල් | 966 | 853 |
| මැයි | 981 | 929 |
| ජූනි | 1,708 | 1,591 |
| ජූලි | 2,592 | 2,481 |
| අගෝස්තු | 3,231 | 3,176 |
| සැප්තැම්බර් | 2,415 | 2,282 |
| ඔක්තෝබර් | 1,616 | 1,280 |
| නොවැම්බර් | 2,316 | 1,965 |
| දෙසැම්බර් | 12,391 | 6,394 |
| **එකතුව** | **35,049** | **27,784** |

මෙම මහජන ඉල්ලීම් වලට අමතරව මහජන ඇමතුම් සහ මහජන සම්බන්ධතා අංශය වෙත පැමිණ සිදු කළ සියළු ඉල්ලීම් සඳහා ද ප්‍රතිචාර දක්වා ඇත.

**සාරාංශය**

| | | |
|---|---|---|
| පිළිතුරු සැපයූ මුළු ලිපි ප්‍රමාණය | - | 27784 |
| ලද මුළු මහජන ඇමතුම් සංඛ්‍යාව | - | 23076 |
| පැමිණි මුළු අමුත්තන් ප්‍රමාණය | - | 7142 |
| ලද පිළිතුරු ලිපි ප්‍රමාණය | - | 6552 |
| පිටපත් ලෙස ගොනු කල ලිපි සංඛ්‍යාව | - | 8906 |
| 2019.12.31 දිනට පිළිතුරු යැවීමට ඇති ලිපි | - | 5997 |
| **ලැබුණු මුළු ලිපි ප්‍රමාණය** | - | **79,457** |

## 2.6. ආයතන කටයුතු

### 2.6.1. ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම

ඊ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුගත වෙමින් අග්‍රාමාත්‍ය කාර්යාලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික අවශ්‍යතා හඳුනා ගනිමින් විසඳුම් ලබාදීමත්, රාජ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික අවශ්‍යතා සපුරාලීමත්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ මූලික අභිමතාර්ථය වේ.

ඒ අනුව, පහත සඳහන් සන්නිවේදන හා තාක්ෂණ සේවා මෙම අංශය මඟින් ඉටු කරනු ලබයි.

- **අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිල වෙබ් අඩවිය**

  අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිල වෙබ් අඩවිය නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම මඟින් භාවිතා කරන්නන්ට කාලීන හා නිවැරදි තොරතුරු කඩිනමින් ලබාදීම සිදු කරයි.

- **අග්‍රාමාත්‍ය කාර්යාලයේ ඊ-මේල් සේවාව**


  දිනෙන් දින දියුණුවන තාක්ෂණය මත පදනම්ව අග්‍රාමාත්‍ය කාර්යාලයේ අභ්‍යන්තර ඊ මේල් සේවාවෙහි ආරක්ෂාව තහවුරු කරමින් වඩාත් විශ්වාසදායී හා ඵලදායී ඊ මේල් සේවාවක් පවත්වා ගැනීමේ හැකියාව ලැබී ඇත.

- **අග්‍රාමාත්‍ය කාර්යාලයේ අභ්‍යන්තර භාවිතය සඳහා මෘදුකාංග පද්ධති නිපදවීම**

  අග්‍රාමාත්‍ය කාර්යාලයේ අභ්‍යන්තර ආයතනික කටයුතු පහසු කර ගැනීම සඳහා අවශ්‍ය මෘදුකාංග තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය මඟින් නිපදවනු ඇත. ඒ අනුව, කැබිනට් පත්‍රිකා පසුවිපරම් කිරීම, ප්‍රවාහන කළමනාකරණය හා ලේඛන කළමනාකරණය සඳහා නිමවනු ලැබූ මෘදුකාංග පද්ධති ක්‍රියාත්මක තත්ත්වයට පත්කර ඇත.

ඉහත ප්‍රධාන කර්තව්‍යයන්ට අමතරව අවශ්‍ය වන පරිදි අග්‍රාමාත්‍ය කාර්යාලයීය තොරතුරු තාක්ෂණික අවශ්‍යතා සපුරාලීමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය කටයුතු කරනු ලැබේ.

අනුමත කළේ,



**ගාමිණී එස්. සෙනරත්**
**අග්‍රාමාත්‍ය ලේකම්**

# 3. 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමස්ථ මූල්‍ය කාර්යසාධනය

## 3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ජීසීඒ-එෆ්

**අග්‍රාමාත්‍ය කාර්යාලය**
**2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

රු.

| අයවැය 2019 | | සටහන | තත්‍ය 2019 | තත්‍ය 2018 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ජීසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 826,700,000 | 778,778,775 | ජීසීඒ-3 |
| - | තැන්පතු | | 14,630,449 | 25,600,082 | ජීසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 26,673,933 | 25,073,080 | ජීසීඒ-5 |
| - | වෙනත් ලැබීම් | | 10,693,093 | 30,058,620 | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **878,697,474** | **859,510,558** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **878,697,474** | **859,510,558** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 318,480,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 298,267,085 | 293,250,911 | |
| 580,445,150 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 506,965,467 | 563,672,812 | |
| 3,000,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 1,900,855 | 1,800,521 | ජීසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| 44,850 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 44,799 | 32,897 | |
| **901,970,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **807,178,206** | **858,757,141** | |
| | **මූලධන වියදම්** | | | | |
| 34,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 28,596,861 | 14,465,205 | |
| 182,600,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 43,934,986 | 76,653,505 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ජීසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 2,400,000 | හැකියා වර්ධනය | 14 | 1,548,050 | 1,334,000 | |
| 600,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | - | - | |
| **819,000,000** | **මුළු මූලධන වියදම් (ඉ)** | | **74,079,897** | **92,452,710** | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)** | | **44,477,133** | **47,656,109** | |
| | **තැන්පතු ගෙවීම්** | | 11,038,455 | 23,648,357 | ජීසීඒ-4 |
| | **අත්තිකාරම් ගෙවීම්** | | 33,438,678 | 22,083,753 | ජීසීඒ-5 |
| | **වෙනත් ( වෙනත් ආයතන)** | | - | 1,924,000 | |
| | **මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)** | | **925,735,237** | **998,865,960** | |
| **1,720,970,000** | **2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)** | | **(47,037,763)** | **(139,355,403)** | |

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | | | | |
|---|---|---|---|---|
| | | | | ඒසීඒ-පී |
| **අග්‍රාමාත්‍ය කාර්යාලය** | | | | |
| **2019 දෙසැම්බර් 31 දිනට** | | | | |
| **මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය** | | | | |
| | | සත්‍ය | | |
| | සටහන | 2019 | | 2018 |
| | | රු. | | රු. |
| **මූල්‍ය නොවන වත්කම්** | | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 19,877,020,205 | | 19,911,272,119 |
| **මූල්‍ය වත්කම්** | | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 47,892,354 | | 41,136,859 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | | - |
| **මුළු වත්කම්** | | **19,924,912,559** | | **19,952,408,978** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | | |
| ශුද්ධ වත්කම් | | 16,243,410 | | 13,079,909 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 19,877,020,205 | | 19,911,272,119 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | | |
| **ජංගම වගකීම්** | | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 31,648,944 | | 28,056,950 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | | - |
| **මුළු වගකීම්** | | **19,924,912,559** | | **19,952,408,978** |

පිටු අංක 05 සිට 28 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 29 සිට 39 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන ගණකාධිකාරි |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | දිනය : 2020 . 02 . 27 |
| දිනය : 2020 . 02 . 27 | දිනය : 2020 . 02 . 27 | |
| ගාමිණී එස් සෙනරත්<br>අග්‍රාමාත්‍ය ලේකම්<br>අග්‍රාමාත්‍ය කාර්යාලය<br>58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත,<br>කොළඹ 07. | ගාමිණී එස් සෙනරත්<br>අග්‍රාමාත්‍ය ලේකම්<br>අග්‍රාමාත්‍ය කාර්යාලය<br>58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත | පී.ඩී.එල්. කුලරත්න<br>ප්‍රධාන ගණකාධිකාරි<br>අග්‍රාමාත්‍ය කාර්යාලය<br>නො. 58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත<br>කොළඹ 07. |

## 3.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | |
|---|---|---|
| | | ඒසීඒ-සී |
| **අග්‍රාමාත්‍ය කාර්යාලය** | | |
| **2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | | |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශය** | | |
| | **සත්‍ය** | |
| | **2019** | **2018** |
| | රු. | රු. |
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | | 804,065,801 |
| වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ මගින් එකතු කරන ලද ආදායම් | 1,597,180 | - |
| අග්‍රිම ලැබීම් | 826,700,000 | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය(අ)** | **828,297,180** | **804,065,801** |
| | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 767,838,214 | 735,729,262 |
| සහනාධාර සහ මාරුකිරීම් | 1,945,655 | 1,833,418 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 5,174,629 | - |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | - |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය(ආ)** | **774,958,498** | **737,562,681** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(ඇ )=(අ)-(ආ)** | **53,338,682** | **66,503,120** |
| | | |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම | 1,192,151 | 1,464,375 |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය(ඇ)** | **1,192,151** | **1,464,375** |
| | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 44,672,456 | 50,917,139 |
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම | 17,816,730 | 17,050,356 |
| අත්තිකාරම් ගෙවීම් | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය(ඉ)** | **62,489,186** | **67,967,495** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය( ඊ)=(ඇ)-(ඉ)** | **(61,297,035)** | **(66,503,120)** |
| | | |
| **(ඊ)** | **(7,958,354)** | **0** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 14,295,795 | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය(ඌ)** | **14,295,795** | **-** |
| | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 6,337,441 | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය(එ)** | **6,337,441** | **-** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය(ඒ)=(ඌ)-(එ)** | **7,958,354** | **-** |
| | | |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)** | **0** | **0** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **-** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **-** | **-** |

# 4 . ආයතනයේ කාර්යසාධන දර්ශක

## 4.1. ආයතනයේ කාර්යයසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම අනුව)

| ප්‍රධාන ක්ෂේත්‍රය | ක්‍රියාකාරකම | දර්ශකය | සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස (%) | | |
|---|---|---|---|---|---|
| | | | 100%- 90% | 75%- 89% | 50%- 74% |
| ජාතික ප්‍රතිපත්ති සම්පාදනය, ඒවා ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම් කිරීම | මැදි ආදායම්ලාභීන් සඳහා නිවාස ඉදිකිරීමේ සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කඩිනම් වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා වන කමිටු සහ අනෙකුත් රැස්වීම් සඳහා පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය | පවත්වන ලද රැස්වීම් සංඛ්‍යාව සහ පසු විපරම් කරන ලද තීරණ සංඛ්‍යාව | | ✓ | |
| | ජාතික ප්‍රතිපත්ති සම්පාදනය | සම්පාදනය කරන ලද ජාතික ප්‍රතිපත්ති සංඛ්‍යාව | | | ✓ |
| | පවතින ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය | ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අදාලව ඉටු කරන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව | | | ✓ |
| | ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මකකිරීම සම්බන්ධයෙන් සමාලෝචනය හා ඇගයීම | සමාලෝචනයට හා ඇගයීමට ලක් කරන ලද ජාතික ප්‍රතිපත්ති සංඛ්‍යාව | | | ✓ |
| | බාහිර සාධකවල වර්ධනය සහ ශ්‍රී ලංකාව කෙරෙහි ඒවායේ බලපෑම සමාලෝචනය කිරීම | ඉටු කරන ලද පර්යේෂණ / සමාලෝචන සංඛ්‍යාව | | | ✓ |
| | සහශ්‍ර අභියෝගතා සංස්ථා ව්‍යාපෘති කාර්යාලයට අදාල ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය | ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව | | | |

| ප්‍රධාන ක්ෂේත්‍රය | ක්‍රියාකාරකම | දර්ශකය | සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස (%) | | |
|---|---|---|---|---|---|
| | | | 100%- 90% | 75%- 89% | 50%- 74% |
| සංහිඳියාව, ආගමික කටයුතු සහ සමාජ සුබසාධනය | සංහිඳියා යාන්ත්‍රනයට අදාල ජාතික තලයේ කටයුතු සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය මගින් සම්බන්ධීකරණය කිරීම | සංහිඳියාවට අදාල කටයුතු සාර්ථකව සම්බන්ධීකරණය වීම<br>සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණ මහ ලේකම් කාර්යාලය මගින් සම්බන්ධීකරණය කරන ලද ක්‍රියාකාරකම් සංඛ්‍යාව | | | ✓ |
| | ජාතික / ආගමික උත්සව සහ සමාජ සත්කාරක සේවාවන්ට අදාල කටයුතු සම්බන්ධීකරණය | සම්බන්ධීකරණය කරන ලද ජාතික / ආගමික උත්සව සහ සමාජ සත්කාරක සේවාවන් සංඛ්‍යාව | ✓ | | |
| | ගරු අග්‍රාමාත්‍යතුමා වෙත ලැබෙන මහජන පැමිණිලි හා දුක් ගැනවිලි වලට අදාල කටයුතු සම්බන්ධීකරණය | ලැබුණු හා පිළිතුරු සපයන ලද මහජන පැමිණිලි සහ දුක්ගැනවිලි සංඛ්‍යාව | ✓ | | |
| ජාත්‍යන්තර සහයෝගීතා වය | විදේශීය දූත මණ්ඩල හා විදේශීය තානාපති සේවයේ නිලධාරින් සමඟ සම්බන්ධතා වැඩිදියුණු කිරීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය | විදේශීය දූත මණ්ඩල හා විදේශීය තානාපති සේවයේ නිලධාරින් සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම යවන ලද / ලැබුණ සන්නිවේදන සංඛ්‍යාව | ✓ | | |
| | ජාත්‍යන්තර සමුළු සඳහා ගරු අග්‍රාමාත්‍යතුමාගේ සහභාගිත්වයට අදාල කටයුතු සම්බන්ධීකරණය | ගරු අග්‍රාමාත්‍යතුමා සහභාගි වූ ජාත්‍යන්තර සමුළු සංඛ්‍යාව | ✓ | | |

| ප්‍රධාන ක්ෂේත්‍රය | ක්‍රියාකාරකම | දර්ශකය | සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස (%) | | |
|---|---|---|---|---|---|
| | | | 100%- 90% | 75%- 89% | 50%- 74% |
| පාර්ලිමේන්තු සහ නීතිමය කටයුතු | ගරු අග්‍රාමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ, අමාත්‍ය මණ්ඩල සටහන් පිළියෙළ කිරීම, ඒවා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සහ පාර්ලිමේන්තු ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම | ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ හා සටහන් සංඛ්‍යාව පිළිතුරු සපයන ලද පාර්ලිමේන්තු ප්‍රශ්න සංඛ්‍යාව | ✓ | | |
| | නීති කෙටුම්පත් සංශෝධන, සමාලෝචනය සහ අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම | නීති කෙටුම්පත් සංශෝධන සම්බන්ධයෙන් ඉදිරිපත් කළ සමාලෝචන හා නිර්දේශ වාර්තා සංඛ්‍යාව | ✓ | | |
| යහපාලන භාවිතයන් | 2018 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සකස් කිරීම | 2018 කාර්යසාධන වාර්තාව නියමිත දිනට ඉදිරිපත් කිරීම | ✓ | | |
| | 2019 වර්ෂයේ ප්‍රගති වාර්තාව සකස් කිරීම | 2019 ප්‍රගති වාර්තාව නියමිත දිනයේදි ඉදිරිපත් කිරීම | | | |
| | 2020 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | 2020 ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනයේදි ඉදිරිපත් කිරීම | ✓ | | |
| | 2020වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | 2020 ප්‍රසම්පාදන සැලැස්ම නියමිත දිනයේදි ඉදිරිපත් කිරීම | ✓ | | |
| | 2018 වර්ෂය සඳහා විසර්ජන ගිණුම සකස් කිරීම | 2018 විසර්ජන ගිණුම නියමිත දිනයේදි ඉදිරිපත් කිරීම | ✓ | | |
| | 2020 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු සකස්කර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම | 2020 අයවැය ඇස්තමේන්තුව නියමිත දිනයේදි ඉදිරිපත් කිරීම | | | |

| ප්‍රධාන ක්ෂේත්‍රය | ක්‍රියාකාරකම | දර්ශකය | සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස (%) | | |
|---|---|---|---|---|---|
| | | | 100%- 90% | 75%-89% | 50%-74% |
| | විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම | ලැබුණු හා පිළිතුරු සපයන ලද විගණන විමසුම් සංඛ්‍යාව | ✓ | | |
| | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම | පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සංඛ්‍යාව | ✓ | | |
| | අභ්‍යන්තර විගණන වාර්තා සකස් කිරීම | සකස් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා සංඛ්‍යාව | ✓ | | |
| | 2020 වර්ෂය සඳහා අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම | 2020 අභ්‍යන්තර විගණන සැලසුම නියමිත දිනට ඉදිරිපත් කිරීම | ✓ | | |
| | නිලධාරීන්ගේ දේශීය හා විදේශීය පුහුණුවීම් සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය | අවසන් කළ දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන් සංඛ්‍යාව<br>පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව | ✓ | | |
| | මානව සම්පත් (කාර්ය මණ්ඩලය) පවත්වාගෙන යාම | අවශ්‍යතාවය අනුව මානව සම්පත් (කාර්ය මණ්ඩලය) පවත්වාගෙන යාම | ✓ | | |
| | කාර්යාලයීය පහසුකම් පවත්වාගෙන යාම | අත්සන් කරන ලද සේවා ගිවිසුම් සංඛ්‍යාව | ✓ | | |
| මහජන අදහස් සහ තොරතුරු හුවමාරුව (ප්‍රචාරණය) | රාජ්‍ය/ජාතික උත්සව හා විශේෂ අවස්ථාවන් සඳහා මාධ්‍ය ආවරණය සැපයීම සඳහා පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණය | මාධ්‍ය ආවරණය කරන ලද රාජ්‍ය/ජාතික උත්සව හා විශේෂ අවස්ථාවන් සංඛ්‍යාව | ✓ | | |

| ප්‍රධාන ක්ෂේත්‍රය | ක්‍රියාකාරකම | දර්ශකය | සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස (%) | | |
|---|---|---|---|---|---|
| | | | 100%- 90% | 75%- 89% | 50%- 74% |
| ආයතනික කළමණාකරණය සහ සංවර්ධනය | කාර්යාලය සඳහා කාර්යාලයීය උපකරණ සහ ගෘහ භාණ්ඩ මිලදී ගැනීම | ඉටුකරන ලද ප්‍රසම්පාදන කාර්යන් සංඛ්‍යාව මිලදී ගන්නා ලද කාර්යාලයීය උපකරණ සහ ගෘහ භාණ්ඩ සංඛ්‍යාව | | ✓ | |
| | කාර්යාලයේ ගොඩනැගිලි ඉදි කිරීම, නවීකරණය සහ නඩත්තු කිරීම | ඉටුකරන ලද ප්‍රසම්පාදන කාර්යන් සංඛ්‍යාව ඉදි කරන ලද, නවීකරණය සහ නඩත්තු කරන ලද කාර්යාලයේ ගොඩනැගිලි සංඛ්‍යාව හා ඒවායේ වටිනාකම | ✓ | | |
| | කාර්යාලය සඳහා යන්ත්‍ර සූත්‍ර, උපකරණ හා වාහන මිලදී ගැනීම හා නඩත්තුව | ඉටුකරන ලද ප්‍රසම්පාදන කාර්යන් සංඛ්‍යාව මිලදීගත් හා නඩත්තු කරන ලද යන්ත්‍ර සූත්‍ර, උපකරණ හා වාහන සංඛ්‍යාව හා එහි වටිනාකම | ✓ | | |
| | කාර්යාලයීය වෙබ් අඩවිය යාවත්කාලීනව පවත්වා ගැනීම | යාවත්කාලීන කරන ලද කාර්යාලයීය වෙබ් අඩවිය | ✓ | | |
| | ආරක්ෂිත පරිසරයක් තුළ අන්තර්ජාල හා ඊමේල් පහසුකම් සැපයීම | ආරක්ෂිත පරිසරයක් තුළ සපයන ලද අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් පහසුකම් | ✓ | | |
| | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම | සම්බන්ධීකරණය කරන ලද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති සංඛ්‍යාව | ✓ | | |

| | ක්‍රියාකාරකම | දර්ශකය | සත්‍ය නිමැවුම ප්‍රතිශතයක් ලෙස (%) | | |
|---|---|---|---|---|---|
| | | | 100%- 90% | 75%- 89% | 50%- 74% |
| | ජාල පද්ධතිය හා සර්වර් නඩත්තු කිරීම | ජාල පද්ධතිය හා සර්වර් නිසි පරිදි අඛණ්ඩව ක්‍රියාත්මක වීම | ✓ | | |
| | තොරතුරු තාක්ෂණ ප්‍රසම්පාදන සඳහා පහසුකම් සැලසීම | සහභාගි වන ලද තාක්ෂණික ඇගයීම් කමිටු සංඛ්‍යාව<br>සකස් කරන ලද ලේඛණ සංඛ්‍යාව | ✓ | | |
| | අභ්‍යන්තර කටයුතු සඳහා අවශ්‍ය මෘදුකාංග නිපදවීම හා පවතින මෘදුකාංග වැඩිදියුණු කිරීම | නිපදවන ලද හා වැඩිදියුණු කරන ලද මෘදුකාංග සංඛ්‍යාව | ✓ | | |

# 5. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ කාර්යසාධනය

## 5.1. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ කාර්යසාධන දර්ශක

| ඉලක්ක/ අරමුණු | ඉලක්ක* | ජයග්‍රහණ* පිළිබඳ දර්ශකයන් | ජයග්‍රහණ ලබා ගැනීමේ වර්තමාන ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%- 49% | 50%- 74% | 75%- 100% |
| 16<br>තිරසාර සංවර්ධනය වෙනුවෙන් සාමකාමී හා සර්වග්‍රාහී සමාජයන් ප්‍රවර්ධනය කිරීම, සියළුදෙනාටම සාධාරණය ඉටුවන, සෑම මට්ටමකදීම සාධනීය බව, වගවීම සහ සියල්ල ඇතුළත්වන ආයතන ගොඩනැගීම | 16.අ<br>16.3 | 16.අ.1<br>16.3.1<br>16.3.2 | | 63% | |
| 9<br>නම්‍යශීලී බවෙන් යුතු යටිතල පහසුකම් ඉදිකිරීම, සර්වග්‍රාහී, තිරසර කර්මාන්තකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවෝත්පාදන දිරිගැන්වීම | 9.1<br>9.4 | 9.1.2<br>9.4.1 | 10% | | |

*** ඉලක්ක සහ දර්ශක**

16.අ - ආයතනවල සියළුම මට්ටම්වල සේවය කරන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීමටත්, විශේෂයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල හිංසනය වැළැක්වීම හා ත්‍රස්තවාදය මෙන්ම අපරාධ මර්දනය කිරීමටත් ජාත්‍යන්තර සහයෝගීතාව ඇතිව අදාළ ජාතික ආයතන ශක්තිමත් කිරීම.

16.අ.1 - පැරිස් ප්‍රතිපත්තිවලට අනුකූල වන ස්වාධීන ජාතික මානව හිමිකම් සුරැකීමේ ආයතන පැවතීම.

16.3 - ජාතික මෙන්ම ජාත්‍යන්තර මට්ටමෙන් නීතියේ ස්වාධිපත්‍ය සුරක්ෂිත කිරීම හා සෑම දෙනෙකුටම යුක්තිය හා සාධාරණය ඉටුවන බවට සහතික වීම.

16.3.1 - අදාළ බලධාරීන් වෙත හෝ නිල වශයෙන් පිළිගත් වෙනත් ගැටුම් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණ වෙත වින්දිතභාවය පිළිබඳව පසුගිය මාස 12 ක කාලය තුළදී වාර්තා කරන ලද වින්දිතයන්ගේ ප්‍රමාණය

16.3.2 - සිරගත කරන ලද සමස්ත ජනගහණයෙන් දඬුවම් නියම නොකරන ලද රැඳවියන් ප්‍රමාණය

9.1 - සියළු දෙනාටම දැරිය හැකිවන හා සමාන ඉඩ ප්‍රස්ථා හිමිවන පරිදි මානව සුභසාධනය හා ආර්ථික සංවර්ධනය උදාකරලීම පිණිස කලාපීය මෙන්ම දේශසීමාන්තර යටිතල පහසුකම් ඇතුලුව ගුණාත්මක, විශ්වාසනීය, තිරසාර මෙන්ම නම්‍යශීලී බවෙන් යුතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

9.1.2 - ප්‍රවාහන මාධ්‍ය පදනම්කරගත් මගී සහ භාණ්ඩ ප්‍රවාහන ධාරිතාවන්

9.4 - සියලුම රටවල් තම හැකියාවන් වලට අනුකූලව අදාළ ක්‍රියාමාර්ග ගනිමින් 2030 වන විට තමන්ට හිමි ස්වාභාවික සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමේ කාර්යක්ෂමතාව සමගින් පිරිසිදු, පරිසර හිතකාමී තාක්ෂණයන් සහ කාර්මික ක්‍රියාවලීන් උපයෝගී කොටගෙන යටිතල පහසුකම් සහ කර්මාන්තවල තිරසරභාවය ඉහළ දැමීමට ක්‍රියාකිරීම

9.4.1 - එකතුකළ අගය ඒකකයක් සඳහා කාබන් ඩයොක්සයිඩ් විමෝචනය

# 6. මානව සම්පත් පැතිකඩ

## 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු/(අතිරික්ත)** |
|---|---|---|---|
| **ජ්‍යෙෂ්ඨ** | 55 | 39 | 16 |
| **තෘතීයික** | 08 | 04 | 04 |
| **ද්විතීයික** | 150 | 117 | 33 |
| **ප්‍රාථමික** | 159 | 127 | 32 |

(2019.12.31 දින දක්වා)

## 6.2. සේවක අතිරික්තය හෝ සේවක හිඟය ආයතනයේ කාර්යසාධනයට බලපාන ආකාරය

පැවැති කාර්යය මණ්ඩලය අනුමත ප්‍රමාණයට වඩා අඩු වුවද ඵලදායී මානව සම්පත් කළමනාකරණය තුළින් කාර්ය සාධනය පවත්වා ගන්නා ලදී.

## 6.3. මානව සම්පත් සංවර්ධනය

| අනු අංක | පාඨමාලාව | සහභාගි වූවන් සංඛ්‍යාව | පුහුණු කාලය | සමස්ත ආයෝජනය | | පාඨමාලාවේ ස්වාභාවය (විදේශීය/ දේශීය) | නිමැවුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රු.000) | විදේශීය $/£ | | |
| 1 | කණිෂ්ඨ විධායකයින් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමාව (අදියර -11) | 10 | සති 10 | 250 | | දේශීය | ඉංග්‍රීසි භාෂාවෙන් සකසන ලිපිවල වැරදි අඩුවීම |
| 2 | කණිෂ්ඨ විධායකයින් සඳහා ඉංග්‍රීසි ඩිප්ලෝමාව (අදියර -1) | 02 | සති 10 | 50 | | දේශීය | |
| 3 | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාව | 01 | 2018/ 2019 | 132 | | දේශීය | වැරදි අඩුවීම |
| 4 | මානව සම්පත් කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 01 | මාස 03 | 39.5 | | දේශීය | |
| 5 | පරිගණක දෘඩාංග සහ පරිගණක නඩත්තුව පිළිබඳ පාඨමාලාව | 01 | දින 02 | 13 | | දේශීය | කුඩා පරිමාණ අළුත්වැඩියාවන් හඳුනා ගැනීම |
| 6 | පරිගණක දෘඩාංග සහ ජාල පාඨමාලාව | 01 | මාස 06 | 34.1 | | දේශීය | |
| 7 | කාර්යාල කාර්ය සහායකයින් සඳහා ආගන්තුක සත්කාර කළමනාකරණ පිළිබඳ පාඨමාලාව | 27 | දින 01 | 101.25 | | දේශීය | අග්‍රාමාත්‍ය කාර්යාලයේ ආගන්තුක සත්කාර කළමණකරණය ඉහළ නැංවීම |
| 8 | රථවාහන කළමනාකරණය | 01 | දින 02 | 7 | | දේශීය | රිය අනතුරු සංඛ්‍යාව අඩුවීම |
| 9 | MS භාවිත කරමින් දත්ත සමුදා කළමනාකරණය | 01 | දින 02 | 13 | | දේශීය | ඵලදායීතාවය වැඩිවීම |
| 10 | කණිෂ්ඨ සේවකයින් සඳහා දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | 57 | පැය 50 | 75 | | දේශීය | භාෂා කුසලතාවය ඉහළ නැංවීම |

| අනු අංක | පාඨමාලාව | සහභාගි වූවන් සංඛ්‍යාව | පුහුණු කාලය | සමස්ත ආයෝජනය | | පාඨමාලාවේ ස්වාභාවය (විදේශීය/ දේශීය) | නිමැවුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රු.000) | විදේශීය $/£ | | |
| 11 | සූප ශාස්ත්‍ර කලාව පිළිබඳ මාස්ටර් ඩිප්ලෝමාව | 01 | මාස 06 | 5 | | දේශීය | ආහාර පාන සේවා සපයන නිලධාරීන්ගේ සේවා තත්ත්වය දියුණු වීම |
| 12 | වැටුප් පරිවර්තන | 03 | දින 02 | 8.5 | | දේශීය | අග්‍රාමාත්‍ය කාර්යාලයේ කාර්යක්ෂමතාවය හා සඵලදායී බව ඉහළ නැංවීම |
| 13 | ගොනු කළමනාකරණය හා පොදු කාර්යාල පරිපාලනය - ආයතන සංග්‍රහය | 02 | දින 03 | 18 | | දේශීය | |
| 14 | රාජ්‍ය නිලධාරීන් සඳහා ඉහළ මට්ටමේ MS excel කුසලතාවය | 01 | දින 02 | 13 | | දේශීය | |
| 15 | රාජ්‍ය තාන්ත්‍රික හා ලෝක කටයුතු පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 02 | අවුරුදු 01 | 40 | | දේශීය | |
| 16 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ගිණුම් පාලනය කිරීම | 02 | දින 01 | 7 | | දේශීය | |
| 17 | ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 01 | සති 04 | 26 | | දේශීය | |
| 18 | MS ප්‍රවේශය භාවිතා කරමින් දත්ත සමුදා කළමනාකරණය | 03 | දින 02 | 13 | | දේශීය | |
| 19 | ආරක්ෂිත රිය පැදවීම | 08 | දින 01 | 28 | | දේශීය | |
| 20 | නිවාඩු ලිපිකරුගේ කාර්ය හා වගකීම | 01 | දින 02 | 8.5 | | දේශීය | |
| 21 | කාර්යාල ක්‍රම | 01 | දින 01 | 3.6 | | දේශීය | |
| 22 | ආරක්ෂාව සහිතව ජාල පරිපාලනය | 01 | මාස 06 | 36.1 | | දේශීය | |
| 23 | ආයතනික සංයුක්ත සැලැස්ම සකස් කිරීමේ උපාය මාර්ග | 01 | දින 02 | 8.5 | | දේශීය | |

| අනු අංක | පාඨමාලාව | සහභාගි වූවන් සංඛ්‍යාව | පුහුණු කාලය | සමස්ත ආයෝජනය | | පාඨමාලාවේ ස්වභාවය (විදේශීය/ දේශීය) | නිමැවුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රු.000) | විදේශීය $/£ | | |
| 24 | වැටුප් පරිවර්තනය | 02 | දින 02 | 8.5 | | දේශීය | අග්‍රාමාත්‍ය කාර්යාලයේ කාර්යක්ෂමතාවය හා සඵලදායී බව ඉහළ නැංවීම |
| 25 | භාණ්ඩ සමීක්ෂණ - පාඩු සහ කපා හැරීම් | 01 | දින 02 | 13 | | දේශීය | |
| 26 | රාජ්‍ය පරිපාලන නීතිය | 01 | මාස 06 | 60 | | දේශීය | |
| 27 | ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශණපති උපාධි පාඨමාලාව | 01 | අවුරුදු 02 | 125 | | දේශීය | නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය |
| 28 | ඉහල බලපෑම් නායකත්ව/කළමනාකරණ කුසලතා සංවර්ධනය | 01 | 2019.01.06 - 2019.02.16 | | $1,200 | ඉන්දියාව | |
| 29 | රජය සතු ව්‍යවසායන් විගණනය කිරීම | 01 | 2019.01.06 - 2019.02.03 | | $1,120 | ඉන්දියාව | |
| 30 | මානව සම්පත් විශ්ලේෂණයේ මූලධර්ම | 01 | 2019.02.17 - 2017.02.25 | | $320 | ඉන්දියාව | |
| 31 | කළමනාකරණය හා ධනාත්මක නායකත්වය | 01 | 2019.02.17 - 2019.03.31 | | $1,200 | ඉන්දියාව | |
| 32 | දරිද්‍රතාවය අවම කිරීම සහ තිරසාර සංවර්ධනය සඳහා සහභාගිත්ව සැලසුම්කරණය | 01 | 2019.02.17 - 2019.03.19 | | $1,200 | ඉන්දියාව | |
| 33 | අවිධිමත් අංශයේ ව්‍යාවසාය, ව්‍යාවසායකත්වය සහ දේශිය ආර්ථික සංවර්ධනය | 01 | 2019.03.03 – 2019.04.14 | | $1,200 | ඉන්දියාව | |

| අනු අංක | පාඨමාලාව | සහභාගි වූවන් සංඛ්‍යාව | පුහුණු කාලය | සමස්ත ආයෝජනය | | පාඨමාලාවේ ස්වභාවය (විදේශීය/ දේශීය) | නිමැවුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රු.000) | විදේශීය $/£ | | |
| 34 | පොකුරු සංවර්ධනය පිලිබඳ පාඨමාලාව | 01 | 2019.03.03 – 2019.04.14 | | $1,200 | ඉන්දියාව | නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය |
| 35 | ජාත්‍යන්තර වෙසක් උත්සවය | 02 | 2019.05.11 - 2019.05.15 | | $3,550 | වියට්නාමය | |
| 36 | මානව සම්පත් සැලසුම් කිරීම සහ සංවර්ධනය | 02 | 2019.07.26 - 2019.07.20 | | $1,200 | ඉන්දියාව | |
| 37 | තිරසාර අරමුණු | 02 | 2019.08.04 - 2019.08.17 | | $520 | ඉන්දියාව | |
| 38 | අධ්‍යක්ෂ ජනරාල් මට්ටමේ තරුණ නිළධාරීන් සඳහා වැඩ කිරීමේ හැකියාව වැඩි දියුණු කර ගැනීම පිළිබඳ සම්මන්ත්‍රණය -2019 | 01 | 2019.08.09 - 2019.08.29 | | $920 | චීනය | |
| 39 | එකම තීරයක්, එකම මාවතක් යටතේ මධ්‍ය කාලීන සහ දිගු කාලීන සැලැස්ම පිළිබඳ සම්මන්ත්‍රණය - 2019 | | 2019.08.09 - 2019.08.29 | | $920 | චීනය | |
| 40 | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා කර්මාන්තපුර ගොඩනැගීම සහ කළමනාකරණය | 01 | 2019.08.21 – 2019.09.12 | | $880 £70 | චීනය | |
| 41 | චීනයේ සංවර්ධන අත්දැකීම් සහ එහි ප්‍රතිසංස්කරණ , ශ්‍රී ලංකාව සඳහා ප්‍රතිපත්ති විවෘත කිරීම | 01 | 2019.09.01 – 2019.10.02 | | $1,200 | චීනය | |
| 42 | නිපුණතා සංවර්ධනය හා රැකියා උත්පාදනය | 01 | 2019.09.02 – 2019.09.20 | | $800 | ඉන්දියාව | |

| අනු අංක | පාඨමාලාව | සහභාගි වූවන් සංඛ්‍යාව | පුහුණු කාලය | සමස්ත ආයෝජනය | | පාඨමාලාවේ ස්වභාවය (විදේශීය/ දේශීය) | නිමැවුම |
|---|---|---|---|---|---|---|---|
| | | | | දේශීය (රු.000) | විදේශීය $/£ | | |
| 43 | අධ්‍යාපනය භාෂාව සහ සුළු ජාතීන්ගේ මානව අයිතිය පිළිබඳ ආසියා - පැසිෆික් කලාපීය සංසදය | 01 | 2019.09.19 – 2019.09.22 | | $960 | තායිලන්තය | නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය |
| 44 | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා 2030 තිරසාර සංවර්ධන න්‍යායපත්‍රය ක්‍රියාත්මක කිරීමේදී දරිද්‍රතාවය පිටුදැකීම | 02 | 2019.10.11 – 2019.10.31 | | $1,760 | චීනය | |
| 45 | කඩදාසි රහිත වෙළඳාම ආසියා පැසිෆික් රටවල් සඳහා ඊ වාණිජ්‍යය | 01 | 2019.10.17 – 2019.11.02 | | $640 | චීනය | |
| 46 | සංස්කෘතික කර්මාන්ත සංවර්ධනය | 02 | 2019.11.21 – 2019.12.11 | | $1760 | චීනය | |
| 47 | තිරසාර සංවර්ධනය සඳහා කණ්ඩායම් ප්‍රවේශය | 01 | 2019.11.18 – 2019.11.22 | | $240 | ඉන්දියාව | |

# 7. අනුකූලතා වාර්තාව

## 7.1. අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනය ඉදිරිපත් කර තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව , සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණය විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමණාකරන කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාලසීමවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කිරීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කිරීම | අනුකූල වේ | | |
| **13** | **පොදු තැම්පත් ගිණුම්** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැම්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැම්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම්** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **15** | **ආදායම් ගිණුම්** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැම්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කිරීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිලිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර , වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිලිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස්කොට තිබීම. | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිලිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අදාළ නොවේ | | |

# 8. විගණකාධිපති නිරීක්ෂණ

## 8.1. විගණකාධිපති නිරීක්ෂණ

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } TRE/B/PMO/02/19/15 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2020 ජූනි 08 දින

ගණන්දීමේ නිලධාරී
අග්‍රාමාත්‍ය කාර්යාලය

**අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට අග්‍රාමාත්‍ය කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ

සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂය තුළදී වැය විෂයය 12 ක මූලධන වියදම් වෙනුවෙන් වූ එකතුව රු. 776,600,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදන වලින් එකතුව රු. 742,698,537 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 69 සිට සියයට 95 දක්වා පරාසයක පැවතුණි.

(ආ) පුනරාවර්තන වියදම් සඳහා වූ වැය විෂයය 28 ක එකතුව රු. 88,650,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදන වලින් එකතුව රු. 48,403,681 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 24 සිට සියයට 98 දක්වා පරාසයක විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NAOSL NATIONAL AUDIT OFFICE

(ඇ) පුනරාවර්තන වැය විෂයයන් 07 ක් සඳහා ප්‍රතිපාදන එකතුව රු. 6,250,000 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 07 ක් සඳහා එකතුව රු. 610,100,000 ක් වූ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිකර තිබුණි. ඒ තුළ පරිපූරක ප්‍රතිපාදන ලබාගත් වැය විෂයයක්ද ඇතුළත්ව තිබුණි. චක්‍රලේඛ විධිවිධාන පරිදි ප්‍රතිපාදන අහුරා තැබීම හා අත්‍යාවශ්‍ය නොවන වියදම් අත්හිටුවා අවමව වියදම් දරමින් වියදම් කළමනාකරණය කිරීම නිසා ඉහත (අ), (ආ) හා (ඇ) හි සඳහන් පරිදි ප්‍රතිපාදන ඉතිරිවූ බව අග්‍රාමාත්‍ය ලේකම්වරයා විගණනයට දන්වා එවා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාළ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

එස්.එම්.ඩී.එස්.එස්. රෝහිත
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට